# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව 2011

## පරිසර අමාත්‍යාංශය

# දැක්ම

"2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ජනතාව සහ
ශ්‍රී ලංකා ආර්ථිකයෙහි යහ පැවැත්ම සහ
චිරස්ථායි සංවර්ධනය සදහා
ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර
සමුද්‍රීය පරිසරයක්
ඇති කිරීම"

# මෙහෙවර

"වර්තමාන සහ අනාගත පරම්පරාව සදහා
සමුද්‍රීය පරිසරය චිරස්ථායි ලෙස කළමණාකරණය කිරීම
සදහා ඵලදායී ලෙස විධි නියමයන් බලාත්මක කිරීම,
අදාල අන්තර්ජාතික ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීම සහ
පරදුදරත්තන් සහ වෙනත් සම්පත් සමායෝජනය කොට
මෙහෙවර යෙදවීම මගින් ශ්‍රී ලංකා පරිසරයෙහි
සමුද්‍රීය දූෂණය වැළැක්වීම, පාලනය සහ කළමණාකරණය
සදහා අවශ්‍ය කුසලතා, නිපුණතා, සංවිධානීය ව්‍යූහය
සහ යටිතල රාමුවක් ඇති ආයතනයක් බවට පත්වීම."

# සංස්ථාමය තොරතුරු

## අධ්‍යක්ෂ මණ්ඩලය

### සභාපති

නීතිඥ ආර්. එස්. ආරියප්පෙරුම

**අධ්‍යක්ෂවරු**

ආර් ඒ ආර් ආර් රූපසිංහ මහතා - ( පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත)

කොමදෝරු එන් බී ජේ රොසයිරෝ - ( නාවික හමුදපතිගේ නියෝජිත)

එස්. එන්. මයාදුන්නේ බණ්ඩාර මිය - ( විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත)

කේ ගුණවර්ධන මිය - ( මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත)

එස්. බණ්ඩාර මහතා - ( ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත)

ජේ. ඩබ්. එච්. එස්. එස්. ආර්. වීරකෝන් මහතා - (අධ්‍යක්ෂ ජෙනරාල්-වෙළඳ නැව් කටයුතු)

නීතිඥ මහේෂ් කටුලන්ද මහතා - (අමාත්‍යතුමා විසින් පත්කළ සාමාජික)

රියර් අද්මිරාල් එස්. ආර්. සමරතුංග මහතා – සාමාන්‍යාධිකාරි

## විගණකවරු

විගණකාධිපති

## ලියාපදිංචි කාර්යාලය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
758, දෙවන මහල
බේස්ලයින් පාර
කොළඹ 09
ටෙලි: 2687520 /2690604 /2690605
ෆැක්ස්: 2687451/4615960
ඊ මේල්: info@mppa.gov.lk
වෙබ්: mepa.gov.lk

## බැංකු කරුවෝ

ලංකා බැංකුව
මහජන බැංකුව

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

සභාපති - නීතිඥ ආර්. එස්. ආරියප්පෙරුම

සාමාන්‍යාධිකාරි-රියර් අද්මිරාල් එස්. ආර්. සමරතුංග ආර්එස්පි විඑස්වි යූඑස්පි

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මෙහෙයුම් - ඩබ් එන් දියබලනගේ මහතා

නීති නිලධාරි- ඒ. කාරියවසම් මෙනවිය (එල් එල් බි , එම් එස් සි.)

ගණකාධිකාරි - ඩී. ආර්. සී. ජයවර්ධන මහතා (බි කොම් (විශේෂ), එල් අයි සි ඒ)

සහකාර කළමනාකරු (මෙහෙයුම්) - ඒ. ජේ. එම්. ගුණසේකර මහතා( බි එස් සි , එම් එස් සි.)

සහකාර කළමනාකරු (පලාත්) - ටී. එස්. රණසිංහ මහත්මිය (බි එස් සි.)
- රේණුකා රණවිර මහත්මිය (බි එස් සි)
- එල් පි ටයිටස් මහතා (බි එස් සි)
- එච් ටි එන් අයි පියදාස(බි එස් සි, එම් එස් සි.)

සහකාර කළමනාකරු (නෞකා සමික්ෂක)- ආර් එන් ප්‍රියදර්ශන මහතා (බි එස් සි)

සහකාර කළමනාකරු (මානව සම්පත්) - ඩබ් එච් කේ හිටිබණ්ඩාර මෙනවිය(බි එස් සි)

අභ්‍යන්තර විගණක - ආර් ඒ එච් ප්‍රේමචන්ද්‍ර මෙනවිය(බි බි ඒ)

සහකාර කළමනාකරු (පාලන) - එස් එම් සි කුමරගේ මහතා(බි බි එම් ජී ටි(විශේෂ)

පරිපාලන නිලධාරි - ජී. පී. නිලාංජනි මහත්මිය (බි ඒ (විශේෂ))

# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
# සම්බන්ධ විය හැකි ස්ථාන

**ප්‍රධාන කාර්යාලය**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
758, දෙවන මහල , බේස්ලයින් පාර
කොළඹ 09
ටෙලි: 2687520 /2690604 /2690605
ෆැක්ස්: 2687451/4615960
ඊ මේල්: info@mppa.gov.lk     වෙබ්: mepa.gov.lk

**දකුණු පළාත් කාර්යාලය සහ ගාලු දිස්ත්‍රික්කයේ කලාපීය කාර්යාලය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
04, ක්ලෝසන් බර්ග් පාර
මාගල්ල , ගාල්ල
ටෙලි: 091-2233547/0718-214184
ෆැක්ස්: 091-2233547

**දිස්ත්‍රික් කාර්යාලය –මාතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
18, විල්මට් බාලසූරිය මාවත
නූපේ,මාතර
ටෙලි: 041-2234250/ 0714-926849
ෆැක්ස්: 041-2234250

**දිස්ත්‍රික් කාර්යාලය –හම්බන්තොට දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 46,දෙවන මහල
රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණය
සිරිබෝපුර, හම්බන්තොට
ටෙලි: 047-2256372/0713-624651
ෆැක්ස්: 047-2256372

**දිස්ත්‍රික් කාර්යාලය –කළුතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
187, 3 මහල, ගාලු පාර
බේරුවල
ටෙලි: 034-2298407/0718-100821
ෆැක්ස්: 034-2298407

**දිස්ත්‍රික් කාර්යාලය –පුත්තලම දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
23, ඊබට් සිල්වා වත්ත
කොළඹ පාර, හලාවත
ටෙලි: 031-2222865/0718-8099899
ෆැක්ස්: 032-2222865

**දිස්ත්‍රික් කාර්යාලය –ගම්පහ දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
704/9A, දෙවන කුරන,
කොළඹ පාර, මීගමුව
ටෙලි: 031-2228606/0718-325678
ෆැක්ස්: 031-2228606

**නැගෙනහිර පළාත් කාර්යාලය සහ**
**දිස්ත්‍රික් කාර්යාලය –ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
4 කණුව, චීන වරාය
ත්‍රිකුණාමලය
ටෙලි: 026-2050805/071-8383363
ෆැක්ස්:026-2050805

# සභාපතිතුමාගේ පණිවුඩය,

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත 2009 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වීම ආරම්භවීමත් සමග සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ලෙස වෙනස් කිරීමට ලක්විය, ගොඩබිම තුලදී පරිසරය හා ඒ ආශ්‍රිත ජීවීන් ආරක්ෂා කිරීම සඳහා විවිධ අණපනත් හා මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී දෙපාර්තමේන්තුව වැනි වඩාත් ශක්තිමත් ව්‍යුහයක් සහිත ආයතන ගණනාවක් ස්ථාපිත කර ඇත, එසේම පරිසරයට සිදුවන හානිය සියළු දෙනාටම දැකගත හැකිවන අතරම පරිපාලන හා දේශපාලනික අවධානය නිරන්තරයෙන්ම ඒ සඳහා යොමුවනු ලබයි,

අතිතයේ සිටම සියළු අපද්‍රව්‍ය සීමාවකින් තොරව නිදහසේ සමුද්‍ර පරිසරයට මුදාහැරීම නිසා ජීවීන්ට හා පරිසර පද්ධතින් වලට සිදුවන හානිය මේ වන තෙක් කිසිදු පාර්ශවයක් විසින් තක්සේරුකර හෝ ගණනය කිරීමක් අප හට නිරීක්ෂණය නොවේ, එසේ හෙයින් සමුද්‍ර පරිසරය ආරක්ෂාකිරීම සඳහා වන මෙම අධිකාරියේ වර්තමාන කාර්යභාරය ඉතා වැදගත් හා ප්‍රමුඛ කාර්යයක් වේ,

2011 වසර තුලදී අධිකාරියේ පරිපාලන ව්‍යුහය සඳහා අත්‍යවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත් අතර කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සඳහා නිලධාරින් 30 කට ආසන්න ප්‍රමාණයක් 2011 වසර තුලදී බඳවා ගැනීමට හැකිවිය,

2011 වසර තුළ අධිකාරිය වෙත 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත යටතේ සකස්කිරීමට යෝජිත රෙගුලාසි වලින් රෙගුලාසි 5 ක් ඇතුලත්වන ඛනිජ තෙල් ඇතුළු ස්භාවික සම්පත් සහ අක්වෙරළ කැණීම් හා ප්‍රයෝජනයට ගැනීම් (සමුද්‍ර පරිසර ආරක්ෂණ) නියෝග 2011/01 2011 මැයි මස 21 වන දින සිට බලාපොරොත්තු වූ පරිදි ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධ කොට බලාත්මක කරන ලදි, මෙම නියෝගයත් සමග සමුද්‍ර පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් වලදී පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලය මෙම අධිකාරිය වෙත ලැබුණි,(E I A Approval) මෙම නියෝගය යටතේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම මගින් වසර තුලදී අධිකාරිය විසින් රුපියල් මිලියන 3,3 ක් පමණ ආදායමක් උපයාගැනීමට හැකිවිය,

2010 වසරේදී MT GRANBA නෞකා අනතුර මගින් සිදුවූ හානියට වන්දි වශයෙන් රුපියල් මිලියන 5,6 ක මුදලකින් රුපියල් මිලියන 4 ක් භාවිතා කරමින් සේවකයන් සඳහා මාස 12 ක වැටුප් ණය ක්‍රමයක් ආරම්භ කිරීම මගින් සේවකයන්ගේ සුබසාධනය සඳහා අධිකාරිය විසින් එම වසර තුලදී කටයුතු කරන ලදි,

2011 වසර තුලදී භාණ්ඩාගාරය මගින් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් ප්‍රතිපාදන වලින් 100% ක්ම සැලසුම් කල පරිදි අදාල කටයුතු සඳහා යොදවන ලදි, එසේම පසුගිය වසරට සාපේක්ෂව 125% කින් පමණ අධිකාරියේ ආදායම වැඩිකර ගැනීමට හැකිවීම වසර තුලදී අධිකාරිය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වේ,

සමුද්‍ර පරිසරය කෙරෙහි රජයේ මෙන්ම පොදු මහජනයාගේද අවධානය යොමු කරවීමටත් ඒ සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන හා නියෝග සකස්කිරීමත්, නව නීති හඳුන්වාදීම මගින් දූෂණයන් වැලැක්වීමට කටයුතු කිරීමත් අධිකාරියට ඉදිරියේදී මුහුණ දීමට සිදුවන අභියෝගයක් වේ, මෙම අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා මා සහ කාර්යමණ්ඩලය ඉතා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරමි,

නීතිඥ ආර් එස් ආරියප්පෙරුම
සභාපති

# පටුන

පිටු අංකය

1 පසුබිම
1.1 හැඳින්වීම 2
1.2 අධිකාරියේ වගකීම සහ කාර්යභාරයන් 2-3

2 මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය 4-13

3 පරිපාලන, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන,
මූල්‍ය හා නීති අංශවල සේවය හා වගකීම
3.1 පරිපාලන අංශය 14
3.2 මානව සම්පත් සංවර්ධන අංශය 15-17
3.3 අභ්‍යන්තර විගණන අංශය 18
3.4 නීති අංශය 19
3.5 මූල්‍ය අංශය 20-23

4 අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන හා සටහන්
4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති 24-25
4.2 2011.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 26
4.3 2011.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය 27
4.4 2011.12.31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය 28
4.5 2011 වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 29
4.6 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 30-36

5 විගණකාධිපති වාර්තාව 36-43

# 1 ,පසුබිම

## 1 ,1 හැඳින්වීම

දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ උපාය මාර්ගයක වැදගත් ස්ථානයක පිහිටා ඇත. අන්තර්ජාතික නීතින්ට අනුකූලව ශ්‍රී ලංකාවට එහි ගොඩබිම් ප්‍රදේශය මෙන් අටගුණයක් පමණ විශාල කලාපයක සම්පත් නෙළා ගැනීමේ අයිතිය හිමිව පවතී. අප රටට අයත් සාගර කලාපය තුළින් පෙර අපර දෙදිග අන්තර්ජාතික නෞකා මාර්ග වැටී ඇත. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය ස්භාවික සම්පත් රාශියකින් සමන්විත වන අතර මෙම සම්පත් නාවික ගමනාගමනය හා ගොඩබිමෙහි සිදු කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ක්‍රමයෙන් දූෂණයට ලක්වෙමින් පවතී.

ඒ අනුව අපේ සමුදුර සම්පත් දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම සඳහා 1981 වර්ෂයේ අංක 59 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණය වැලැක්වීමේ අධිකාරිය ස්ථාපනය කරන ලදි. සමුද්‍ර දූෂණය සිදුවන අවස්ථාවන්හිදි අවශ්‍ය කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා රජයට අදාල වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මක කිරීම උදෙසා අධිකාරිය වෙත පැවරී තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරීමට එවකට පැවති පනත අවලංගු කර 2008 වර්ෂයේ අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ නව පනත සම්මත කරන ලදුව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදි. මෙම පනත අනුව මෙම අධිකාරිය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් නැවත නම් කරන ලදි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව නාවික මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීම ප්‍රධාන අරමුණක් වේ. මෙම අරමුණ සමග ලංකාව වටා නව වරායන් ඉදිකිරීම, තිබෙන වරායන් වැඩිදියුණු කිරීම සිදුවේ. එයට අමතරව සාගර සම්පත් උකහා ගැනීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කරමින් පවතී. එමනිසා මෙම සංවර්ධන ක්‍රියාමාර්ග වලින් සිදුවන දූෂණය අවම කිරීම සහ ඒවා තිරස්ථායිව පවත්වා ගැනීමට මෙම අධිකාරියේ දායකත්වය ලබාදිය යුතුව පවතී.

මේ අනුව මෙම අධිකාරිය සමුද්‍ර ස්භාවික සම්පත් දූෂණය අවම කිරීම, අඩු කිරීම හා පාලනය කිරීම සඳහා වූ ආයතනය ලෙස ඒ සඳහා වැඩසටහන් රාශියක් දියත් කරමින් පවතී.

## 1,2 අධිකාරියේ වගකීම් සහ කාර්යභාරයන්

1 සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතෙහි ප්‍රතිපාදන සහ එම පනත අනුව සම්පාදනය කරන ලද රෙගුලාසි ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම.

2 ශ්‍රී ලංකා ජල තීරයේ හෝ නීතිය යටතේ අනාගතයේදී ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ හා වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රය සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය වීම වැලැක්වීමේ, අවම කිරීමේ , පාලනය කිරීමේ සහ කළමනාකරණ කාර්යයන් සඳහා වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ එය ක්‍රියාවේ යෙදවීම.

3 ශ්‍රී ලංකා ජල තීරයේ හෝ නීතිය යටතේ අනාගතයේදී ප්‍රකාශයට පත්කරනු ලබන වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ හා වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත යම් කටයුත්තක් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන දූෂණයවීම් වැලැක්වීමේ , අවම කිරීමේ, පාලනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්යයන් සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන සහ රජයේ සහ පෞද්ගලික ආයතන සමග සහයෝගයෙන් පර්යේෂණ පැවැත්වීම.

4 ශ්‍රී ලංකා ජල තීරයේ හෝ නීති ප්‍රකාරව අනාගතයේදී ප්‍රකාශයට පත්කරනු ලබන වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය කළමනාකරණය කිරීම , සුරක්ෂිත කිරීම හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

5 යම් තෙල් වර්ගයක් හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයන් සඳහා ප්‍රමාණවත් වන ප්‍රතිග්‍රහන පහසුකම් ඵලදායි ලෙස සැලසීම.

6 ශ්‍රී ලංකා රජය විසින් ස්ථිර කිරීම, පිළිගැනීම, එකගවීම හෝ අනුමත කිරීම සිදු කර ඇති හෝ අනුමත කරනු ලැබිය හැකි සමුද්‍ර දූෂණය සම්බන්ධ සියලු ජාත්‍යන්තර සම්මුතීන්ට සහ අදාල ප්‍රොටෝකෝල පිළිගැනීම හා නිර්දේශ කිරීම.

7 හදිසි තෙල් විසිරීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

8 ඛනිජතෙල් හෝ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්භාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් සහ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, නීති සැකසීම සහ පරීක්ෂා කිරීම.

9 සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතා පිළිබඳ විවිධ ප්‍රජා කණ්ඩායම් අතර දැනුවත් බව ඇති කිරීම.

10 ඉහතින් වූ කාර්යයන් සියල්ල හෝ යම් කාර්යයක් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් යම් දේ හෝ සියලු දේ සිදුකිරීම.

11 යම් නැව් ආශ්‍රිත කටයුත්තකින් හෝ වෙරළ අශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගතවන යම් දූෂණයකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ සමුද්‍ර කලාප නීතිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද හෝ අනාගතයේදී එබදු නීතියක් යටතේ ප්‍රකාශයට පත්කරනු ලබන වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය ඵලදායි ලෙස සුරක්ෂිත කිරීම හා ආරක්ෂා කිරීම.

12 යම් නැව් ආශ්‍රිත කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගතවන යම් දූෂණයක් සම්බන්ධයෙන් පරික්ෂණ සහ විමසීම් පැවැත්වීම සහ නඩු පැවරීම.

13 දූෂණය වැලැක්වීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ සමුද්‍ර කලාප නීතිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද හෝ අනාගතයේදී එබදු නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ පවත්වාගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකරින් මෙහෙයුම් සියල්ල අධීක්ෂණය (Oversee) කිරීම.

# 2. මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන වගකීම වේ. ගොඩබිම මගින්, නෞකා මගින් හා සමුද්‍රීය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් ඇතිවන සමුද්‍ර දූෂණය අවම කිරීම පාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා මෙම අධිකාරිය විසින් වසර තුළදී පහත වැඩසටහන් හා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබිය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ තාක්ෂණික අංශය සියළුම තාක්ෂණික කටයුතු ක්‍රියාත්මක කිරීම සැලසුම් කිරීම, ගොඩබිම හා සමුද්‍ර ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් සිදුවන සමුද්‍ර දූෂණය අවම කිරීම පාලනය කිරීම සහ කළමනාකරණය සඳහා වූ ප්‍රතිපත්ති සැකසීම මෙන්ම අදාල නෛතික හා තාක්ෂණික අවශ්‍යතා සපුරාලන පාර්ශවයන් වෙත කාර්යයන් කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීමද සිදුකරනු ලබයි.

### 01. හදිසි තෙල් විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්ම (NOSCOP)

### 1.1 දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩමුළු සහ පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපය තුළ සිදුවන හදිසි තෙල් විසිරීමක දී සිදුවිය හැකි පාරිසරික හානිය වළක්වා ගැනීම හා අවම කිරීමේ වගකීම සහිත ආයතනය ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හදිසි තෙල් විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්මක් සකස් කර ඇති අතර මෙවැනි අවස්ථාවක් සඳහා භාවිතා කළ හැකි එකම ජාතික සැලැස්ම ද වන මෙම සැලැස්ම මුල් වරට සකස් කරනු ලැබුයේ 1995 දිය. එතැන් සිට කීපවරක් යාවත්කාලීන කිරීම් වලට ලක් කර ඇති අතර සැලැස්ම සඳහා 2004 වසරේදී කැබිනට් අනුමැතිය ලැබී ඇත.

හදිසි තෙල් විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්මට අනුව විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට හා රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයින්ට, ප්‍රාදේශීය හා ජාතික දේශපාලන නායකත්වයට විශේෂ වගකීම් රාශියක් පැවරෙන අතර සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය ඉතා වැදගත්වේ. ඒ නිසා මෙම සැලැස්මට අදාල සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ දිප ව්‍යාප්ත වැඩසටහනක් 2011 වසරේ දී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පුත්තලම, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල වෙරළබඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශ ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 18 ක් 2011 වසර තුළ පවත්වන ලදී. එහිදී ,

I. සමුද්‍ර පරිසරයේ වැදගත්කම
II. සමුද්‍ර පරිසරය මත තෙල් වල බලපෑම
III. හදිසි තෙල් විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්ම
IV. දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන බූම් එකක් (තෙල් සඳහා බාධකයක්) සකස් කිරීම.

යන මාතෘකා යටතේ දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙමගින් හදිසි තෙල් විසිරීමක් සිදු වූ විට ජාතික සැලැස්ම මගින් විවිධ ආයතන වලට පවරා ඇති වගකීම් ඉටු කිරීම ඉතා ඉක්මනින් සිදුකිරීමට හැකිවන පරිදි විවිධ ක්ෂේත්‍රවල පුද්ගලයින් පුහුණු කරන ලදී.

## 1.2 පළමු ප්‍රතිචාර දක්වන්නන් සඳහා වන පුහුණු වැඩසටහන

හදිසි තෙල් විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්මට අනුව මුලින්ම ප්‍රතිචාර දක්වන්නන් තුළ ඒ සම්බන්ධව පවතින දැනුවත් භාවය අදාල තෙල් විසිරීම පාලනය සඳහා ඉතා වැදගත්වේ. එහෙයින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් අදාල සැලැස්මට අනුව පළමු ප්‍රතිචාර දක්වන්නන් සඳහා තෙදින වැඩමුළුවක් 2011 දෙසැම්බර් 14, 15, 16, දින වල රාජගිරිය බැංකු විදු පියස ශ්‍රවනාගාරයේ දී පැවැත්විය. එයට සමගාමීව ප්‍රායෝගික වැඩසටහනක් කොළඹ වරාය පරිශ්‍රය තුළ දී සිදු කරන ලදී. වැඩමුළුව සඳහා ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, මධ්‍යම පරිස අධිකාරිය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය ආදී ආයතනවල නිළධාරීන් 70 දෙනෙකු සහභාගි වූ අතර එහිදී තෙල් විසිරීම සඳහා වන අවධානම ඇගයීම, හදිසි තෙල් විසිරීම පිළිබඳ ජාතික සැලැස්ම, තෙල් වලින් සිදුවිය හැකි පාරිසරික බලපෑම, හදිසි තත්ව වලදී ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් හා ක්‍රියාවලිය, තෙල් විසිරීමෙන් පසු එකතු වන අපද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කිරීම, ප්‍රවාහනය හා ප්‍රතිග්‍රහනය වැනි හදිසි තෙල් විසිරීමක් සඳහා ප්‍රතිචාර දැක්වීමේ දී ඉතා වැදගත් වූ මාතෘකා යටතේ පුහුණු කිරීම කරන ලදී.

## 1.3 රසායනික ද්‍රව්‍ය විසිරුමක දී ප්‍රතිචාර දැක්වීම

තෙල් විසිරීමක දී මෙන්ම රසායනික ද්‍රව්‍ය විසිරීමක දී සමුද්‍ර පරිසරයට සිදු විය හැකි හානිය ඉතා විශාල වේ. මේ නිසා එවැනි අවස්ථාවක දී අදාල ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු වලට ද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිළධාරීන් සම්බන්ධ වීම සිදුවේ. එවැනි අවස්ථාවක දී භාවිතා කිරීම සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල දෙකක් මිළදී ගැනීමට 2011 ක්‍රියාකරන ලදී. ( රසායන ද්‍රව්‍ය විසිරීම ආශ්‍රිත නිරීක්ෂණ කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා ඉතා වැදගත් වේ)

## 02. ජාත්‍යන්තර සම්මුතිය හා නීතිමය කටයුතු

**2.1 නව පනතට අනුව රෙගුලාසි සකස් කිරීම.**

2008 අංක 35 දරණ සමුද්‍රීය දූෂණ වැලැක්වීමේ පනතට අනුව නව රෙගුලාසි 10ක් සකස් කර පරිවර්තන කටයුතු අවසන් කිරීම 2011 වසර තුළ දී සිදු විය. එසේම එම පනත යටතේ පළමු රෙගුලාසිය ලෙස 2011 අංක 01 දරණ ඛනිජතෙල් ඇතුළු ස්වාභාවික සම්පත් සඳහා අක්වෙරළ කැණීම හා ප්‍රයෝජනයට යොදා ගැනීමේ නියෝග 2011/06/07 දා ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත් කරන ලදී. එම නියෝග 2011 මැයි මස 26 වන දින සිට බලපැවැත්වේ. මෙමගින් තෙල් ගවේෂණයේදී සිදුවන සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග හඳුන්වාදී ඇත. එම රෙගුලාසියට අනුව සමුද්‍ර පරිසරය ආරක්ෂා කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම සියලු තෙල් ගවේශණ කරන කොන්ත්‍රාත්කරුවන් විසින් කළ යුතුය.

2011 වර්ෂය තුළ මෙම රෙගුලාසි හඳුන්වාදීමෙන් පසු සමුද්‍ර පරිසර ආරක්ෂණ බලපත්‍ර තුනක් නිකුත් කර බලපත්‍ර ගාස්තු ලෙස රුපියල් මිලියන 3.3 ක මුදලක් උපයාගෙන ඇත.

2.2 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 51(2) වගන්තිය යටතේ සම්පාදනය කළ යුතු රෙගුලාසි 18 න් 10 ක් කෙටුම්පත්කොට සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලට පරිවර්තනය කොට නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත

2.3 බංකරින් හා හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක වන ජාතික සැලැස්මට අදාල අවසාන නීති කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇති අතර, එකගතාවයකින් පසුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 03. පාසල් සමුද්‍ර කණ්ඩායම්

සමුද්‍ර පරිසරය හා එය දූෂණයෙන් තොරව පවත්වා ගෙන යාමේ වැදගත්කම පිළිබඳ පණිවිඩය ජනතාව අතරට ගෙනයාම සඳහා විවිධ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් සිදු කරනු ලබන අතර ඒ අතරින් ප්‍රධානතම වැඩසටහන වනුයේ පාසල් සිසුන් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහනයි.





හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, කොළඹ, ගම්පහ සහ පුත්තලම යන වෙරළාසන්න දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති සමුද්‍ර පාසල් කණ්ඩායම් සංඛ්‍යාව 225ක් දක්වා ඉහළ නැංවීමට 2011 වසර තුළ ක්‍රියාකර ඇත. මෙම කණ්ඩායම් හා සම්බන්ධ මුළු සාමාජිකයින් සංඛ්‍යාව 2011 වසර අවසානය වන විට 5,625ක් ඉක්මවා තිබිණි. එම සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 250 ක් දිවයින පුරා වෙරළබඩ පාසල් වල දී පවත්වන ලදී.



සමුද්‍ර පාසල් කණ්ඩායම් සඳහා ලාංඡනය නිර්මාණය කිරීම සඳහා තරගයක් දිවයින පුරා වෙරළබඩ දිස්ත්‍රික්කවල පැවති අතර දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරන ලද සිසුන්ට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රධානය කරන ලදී.

දිස්ත්‍රික්කයකින් තෝරාගත් පාසල් 10 බැගින් පාසල් 70 ක සමුද්‍ර තොරතුරු මධ්‍යස්ථාන 70 ක් පවතින අතර 2011 වසරේ දී ඒවා තව දුරටත් දියුණු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව එම මධ්‍යස්ථාන වලට අවශ්‍ය සඟරා, පත්‍රිකා, පොත් සිතියම් ආදිය සපයන ලදී.

## 04. ජගත් සාගර දිනය සැමරිම

“සයුරු සම්පතින් - හරිත ලොවකට” තේමාව යටතේ 2011 ජගත් සාගර දිනය සැමරිමේ ජාතික උත්සවය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධානත්වයෙන් 2011 ජූනි 08 දින පවත්වන ලදී. කොළඹ වරායේ දි ජෙට්ලයිනර් නෞකාව තුල පැවති උත්වසවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා සහභාගී විය.




උත්සවයේ ප්‍රධාන දේශනය “සාගරය ආශ්‍රිත උවදුරු සහ ඒවායේ බලපෑම” මැයෙන් මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සමන්ත හෙට්ටිආරච්චි සහතා විසින් සිදු කරන ලදී



සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික ප්‍රකාශයක් වන “සත් සමුදුර” සාර සංග්‍රහය එළි දැක්වීම එදින සිදු විය. පාසල් සිසුන් හා රාජ්‍ය නිළධාරින් ඇතුළු 250 ක පමණ පිරිසක් මේ සඳහා සහභාගි විය.

## 05. අන්තර්ජාතික වෙරළ පිරිසිදු කිරීමේ දින වැඩසටහන

සෑම වසරකම සැප්තැම්බර් මස තුන්වන සෙනසුරාදා ලෝකයේ රටවල් විශාල සංඛ්‍යාවක් වෙරළ පිරිසිදු කිරීමේ දිනය ලෙස සමරනු ලබන අතර ශ්‍රී ලංකාව ද 2008 වසරේ සිට මේ සඳහා එක් වී ඇත. සමුද්‍ර පරිසර දූෂණය සඳහා ගොඩබිම දායකත්වයේ ප්‍රමාණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම මෙහි දී ප්‍රධාන වශයෙන් බලාපොරොත්තුවේ. 2011 වසරේ දී පුත්තලම, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය හා යාපනය යන දිස්ත්‍රික්කවල තෝරාගත් ස්ථාන 22ක දී වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන සැප්තැම්බර් 13 සිට 19 දක්වා දිනවල සිදු කරන ලදී. ඒ අතරින් ප්‍රධාන වැඩසටහන 1,500 කගේ පමණ සහභාගිත්වයෙන් යාපනයේ පේදුරු තුඩුව ප්‍රදේශයේ සැප්තැම්බර් 19 වන දින සිදු කරන ලදී. මෙම වැඩසටහන් සඳහා 3,500ක පමණ පිරිසක් සහභාගි වූ අතර පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීන් ආදී පිරිස් ඒ අතර විය. එදින ලංකාවේ එකතු කරන ලද අපද්‍රව්‍ය වර්ගීකරණය කරන ලද අතර රැස් කරන ලද දත්ත International Ocean Conservancy ආයතනයට යොමු කර ජාත්‍යන්තර ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.









## 06. ජල තත්ව පරීක්ෂණය

### 6.1 මුහුදට ගලා එන ජල ප්‍රභවවල තත්ව පරීක්ෂණය



සාගර දූෂණයට බලපාන හේතු සාධක වලින් බහුතරය පවතින්නේ ගොඩබිම ආශ්‍රිතවය. ඒ අනුව ගොඩබිම ජනනය වන දූෂක ජල පහර ඔස්සේ මුහුදට එකතු වේ. මේ නිසා මුහුදට ගලා බසින ජලයේ තත්වය පිළිබඳ අවබෝධය සාගර දූෂණය පිළිබඳව ක්‍රියාත්මක වීම සඳහා ඉතා වැදගත්වේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල පැවති හම්බන්තොට සිට පුත්තලම දක්වා වෙරළබඩ දිස්ත්‍රික්කවල තෝරාගත් ජල පහරවල ජල තත්ව පරීක්ෂා කටයුතු 2011 වසර පුරා සිදු කරන ලදී. ඒ සඳහා ප්‍රාදේශීය කාර්යාලවලට අවශ්‍ය උපකරණ මිලට ගැනීම ද සිදු කරන ලදී.

### 6.2 මුහුදු ජල ස්නානය කරන ස්ථානවල ජල තත්ව පරීක්ෂණය



ශ්‍රී ලංකාවේ මුහුද ආශ්‍රිතව සිදුකරන ප්‍රධානතම විනෝදාත්මක කටයුත්ත ලෙස ජල ස්නානය හැඳින්විය හැක. මෙය දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් බොහෝ මුහුදු තීරවල බහුලව දැකිය හැකි ක්‍රියාකාරකමකි.

එවැනි ස්ථානයක් ලෙස බේරුවල, මොරගොල්ල වෙරළ තෝරාගෙන වසර පුරා එහි ජල තත්ව පරීක්ෂණය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදු කරන ලදී. මෙහි අරමුණ වනුයේ මුහුදේ නාන ස්ථානවල ජල තත්වය නාන පුද්ගලයන්ගේ සෞඛ්‍යයට තර්ජනයක් නොවන ලෙස දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමයි.

## 07. දැනුවත් කිරීමේ වැඩසටහන

### 7.1 රාජ්‍ය නිලධාරීන් , හෝටල් හිමියන්, ධීවරයන් ඇතුළු ජනතාව දැනුවත් කිරීම.



සමුද්‍රය ආශ්‍රිත විවිධ පාර්ශවකරුවන් සමුද්‍ර දූෂණය පිළිබඳ දැනුවත් කිරීම සමුද්‍ර දූෂණය පාලනය සඳහා ගතහැකි නවත් වැදගත් පියවරකි. ඒ නිසා වෙරළ කලාපයේ හෝටල් හිමියන් හා ධීවර ප්‍රජාව වෙනුවෙන් වැඩමුළු 50 ක් පමණ දිවයින වටා වෙරළබඩ දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

### 7.2 දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම.

සමුද්‍ර දූෂණය පිළිවඳව ඇති නීතිමය තත්වය හා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ වැදගත්කම සඳහා දැක්වෙන පුවරු දිවයින වටා මුහුදු තීරයේ ස්ථාපිත කිරීමට 2011 වසර තුළ ක්‍රියාකර ඇත. ඒ අනුව උතුරු නැගෙනහිර ද ඇතුළත්ව දිවයින වටා සියළු වෙරළබඩ දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ පුවරු 120 ක් ස්ථාපනය කර ඇත.



### 7.3 ප්‍රචාරක වැඩසටහන්

සමුද්‍රීය පරිසර ආරක්‍ෂණ අධිකාරියේ ක්‍රියාකාරිත්වය, ව්‍යාප්තිය හා අනාගත සැලසුම් පිළිබඳ වාර්තා වැඩසටහනක් “අපට සමීප ඇත සමුදුර” නමින් නිෂ්පාදනය කරන ලද අතර ආයතනය පිළිබඳ දැනුවත් කිරීම් කටයුතු සඳහා එය භාවිතා කරන ලදී. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දිනපතා ප්‍රචාරය සඳහා “සුරකිමු සමුදුර” නමින් වැඩසටහනක් මාස 2 ක් ප්‍රචාරය කරන ලද අතර එමගින් ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදී.

## 08. නැව් වල ජනනය වන අපද්‍රව්‍ය සඳහා ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම

ශ්‍රී ලංකාවේ නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා වන අන්තර්ජාතික සම්මුතියට අත්සන් තබා ඇත. මෙම සම්මුතියට අනුකූලව ශ්‍රී ලංකාවට පැමිණෙන නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම සැලසීම කල යුතුය. නැව් වලින් ඉවතලන දැවි තෙල් හා අපද්‍රව්‍ය නිසා සමුද්‍ර දූෂණය වලක්වා ගැනීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්‍ෂණ අධිකාරිය එම නැව් සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීමේ සේවාවක් පවත්වාගෙන යයි. 2011 වසරේ දී මෙම සේවාව කොළඹ හා ගාල්ල වරාය තුල ක්‍රියාත්මක විය. මේ සඳහා තුන්වන පාර්ශවයක් ලෙස ප්‍රතිග්‍රහණ පහසුකම් සපයන සමාගම් භාවිතා කරනු ලබයි. සෑම වසරක් ආරම්භයේදීම මේ සඳහා සුදුසුකම් සපුරා ඇති සමාගම් ලියාපදිංචි කරනු ලබයි. 2011 වසර සඳහා සමාගම් 20 ක් ලියාපදිංචි වන ලදී. එම සමාගම් මගින් එක් එක් නැවෙන් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය සඳහා සමුද්‍රීය පරිසර ආරක්‍ෂණ අධිකාරියෙන් බලපත්‍ර ලබා ගත යුතු අතර නැවෙන් අපද්‍රව්‍ය ලබා ගැනීමේ සිට ඒවා නිසිපරිදි අපහරණය වන තෙක් ක්‍රියාවලිය අධිකාරිය විසින් අධීක්‍ෂණය කරනු ලබයි. ලියාපදිංචි වූ සේවා සපයන සමාගම් සඳහා 2011 ජනවාරි 07 වන දා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී. 2011 වසර තුල නැව් 975 ක් සඳහා බලපත්‍ර ලබාගෙන ඇති අතර ඒ මගින් දැවි තෙල් මෙට්‍රික් ටොන් 19,250 ක් ද අපද්‍රව්‍ය ඝන මීටර් 6,000 ක් ද ප්‍රතිග්‍රහණය කර ඇත. මෙය ඊට පෙර වසරට සාපේක්‍ෂව 20% ක වර්ධනයකි.


## 09. දැයට කිරුළ ප්‍රදර්ශනය

බුත්තල ප්‍රදේශයේ පැවති දැයට කිරුළ 2011 ප්‍රදර්ශනයට පරිසර අමාත්‍යාංශය සමග සමුද්‍රීය පරිසර ආරක්‍ෂණ අධිකාරිය ද සහභාගි වූ අතර දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයෙන් පාසල් 25ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඒ සඳහා සිසුන් 1,500 ක් පමණ සහභාගි වන ලදී.



## 10. ඛණිජ තෙල් හා ස්වාභාවික සම්පත් ගවේෂණය අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ ඛණිජ තෙල් ගවේෂණ කටයුතු වසර කිහිපයකට පෙර ආරම්භ වූ අතර 2011 වසර වන විට පළමු බිම් කොටසේ ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතව තිබිණි. මෙම ගවේෂණ කටයුතු සම්බන්ධව පාරිසරික ඇගයීම් අධීක්ෂණය හා පාරිසරික හානිය අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ වගකීම පැවරී ඇත්තේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට බැවින් 2011 වසර තුල මේ සම්බන්ධ අඛණ්ඩව ක්‍රියාවලියක නිරත වීමට අධිකාරියට සිදු විය. අදාල සමාගම මගින් ඉදිරිපත් කරන ලද පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ඇගයීම හා අදාල ව්‍යාපෘතිය අනුමත කිරීමට අවශ්‍ය පියවර ගැනීම එම ක්‍රියාවලියේ ආරම්භය විය. ඉන් පසු අදාල සියළු කොන්දේසි සැපිරීමෙන් අනතුරුව එම සමාගම සඳහා සමුද්‍ර පරිසර ආරක්ෂණ බලපත්‍ර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් නිකුත් කරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුල අධිකාරියේ නිලධාරීන් එම ස්ථානයට ගොස් අඛණ්ඩව නිරීක්ෂණ කටයුතු වල නිරත වන ලදී. පාරිසරික ඇගයීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුලදී සමාගම විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අධීක්ෂණය කිරීම ද සිදු කරන ලදී. 2011 වර්ෂය තුලදී සමුද්‍ර පරිසර සංරක්ෂණ බලපත්‍ර තුනක් නිකුත් කරන ලදී.








# 3 පරිපාලන, නීති , මානව සම්පත් සංවර්ධන , අභ්‍යන්තර විගණන සහ මූල්‍ය අංශවල සේවය සහ වගකීම

## 3.1 පරිපාලන අංශය

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරිම හා සියලුම පරිපාලන කටයුතු සිදුකිරිම (සියලුම බඳවා ගැනීම්, විනය කාර්යය පටිපාටි ක්‍රියාත්මන කිරිම,මිලදි ගැනිම්ද ඇතුලත්ව) පරිපාලන අංශයේ වගකීම වේ. අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරිවරයාගේ සියලු මගපෙන්වීම යටතේ පාලන අංශය කටයුතු කරනු ලබයි.

**අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| තනතුර | අනුමත සංඛ්‍යාව | තියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරින් | 01 | 01 | 00 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් | 04 | 00 | 04 |
| මධ්‍යම කළමණාකරුවන් | 11 | 05 | 06 |
| කනිෂ්ඨ කළමණාකරුවන් | 12 | 08 | 04 |
| බලාත්මක නිලධාරින් | 12 | 04 | 08 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 02 | 02 | 00 |
| කළමනාකරණ සහකාර | 08 | 08 | 00 |
| ශ්‍රේණිගත නිලධාරින් | 06 | 05 | 01 |
| අර්ධ ශ්‍රේණිගත නිලධාරින් | 64 | 47 | 17 |
| ශ්‍රේණිගත නොවන නිලධාරින් | 09 | 08 | 01 |
| එකතුව | 129 | 88 | 41 |

**වසර තුලදී පාලන අංශයේ විශේෂ ක්‍රියාකාරකම්**

1 සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය සඳහා සකස් කරන ලද නව බඳවා ගැනිමේ පටිපාටිය 2011.05.12 දින කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදි. ඒ අනුව මෙතෙක් බඳවා ගැනිම සඳහා අනුමැතිය ලබා නොදුන් තනතුරු සඳහා බඳවා ගැනිම් සිදුකිරිමට අවසර ලබාදෙන ලදි.

2 වසර තුලදි නව බඳවා ගැනිමේ පටිපාටිය අනුගමනය කරමින් නිලධාරින් 31 දෙනෙකු බඳවා ගන්නා ලදි.මේ අතරින් නිලධාරින් හත්දෙනෙකු අභ්‍යන්තර උසස් කිරිම් ලෙස නව තනතුරු සඳහා බඳවා ගෙන ඇත.

3 අධිකාරියේ කටයුතු නැගෙනහිර පළාත තුලද ව්‍යාප්ත කිරිමේ අරමුණින් මෙම අධිකාරියේ ත්‍රිකුණාමල දිස්ත්‍රික් කාර්යාලය හා නැගෙනහිර පළාත් කාර්යාලය ත්‍රිකුණාමලයේ ස්ථාපිත කරන ලදි.

4 අධිකාරියේ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදුකිරිම සඳහා ඩබල් කැබ් රථ දෙකක් මහභාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදි.

## 3.2 මානව සම්පත් සංවර්ධන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන් පුහුණු කිරීම තුලින් ඔවුන්ගේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ වගකීම වේ. 2011 වර්ෂයේ දි මානව සම්පත් සංවර්ධනය සඳහා වෙනමම අංශයක් ආරම්භ කල අතර ඉදිරියේදී අධිකාරියේ මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යය වේ. අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරිවරයාගේ සියලු මගපෙන්වීම් යටතේ මෙම අංශයද කටයුතු කරනු ලබයි.

### අංශයෙහි වගකීම්

1. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම සඳහා වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සම්පත් දායකයින් හඳුනා ගනිමින් දේශීය/විදේශීය පුහුණු සැලසුම් සකස් කිරීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් එකී පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.

2. පුහුණු වීම් ලබන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නිසි පරිදි පුහුණුවීම ලබා ගන්නේද එසේ නොමැති නම් එහි අඩුපාඩු තිබේද යන්න පසුවිපරම් කිරීම සහ අඩුපාඩු මග හරවා ගැනීමට අදාල ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

3. කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම

4. සේවක ශ්‍රේණිගත කිරීම් හා උසස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම

5. සේවක මණ්ඩල හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා සෙසු බාහිර පාර්ශවයන් විසින් ඉල්ලා ඇති තොරතුරු සාමාන්‍යාධිකාරිවරයාගේ අනුමැතියට යටත්ව යොමු කිරීම

6. **සේවක සුබසාධන කටයුතු.**

මෙම වසරේදි අධිකාරියේ නිලධාරින් සහභාගි වූ දේශිය සහ විදේශිය පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ

**2011 වර්ෂය තුල සහභාගි වූ දේශිය පුහුණු වැඩසටහන්**

| අනු අංක ය | නම | තනතුර | පාඨමාලාවේ නම | කාලය | ආයතනයේ නම |
|---|---|---|---|---|---|
| 01 | අශ්විනි කාරියවසම් මෙය | නිති නිළධාරිනි | ICLP – CCC Certificate Course on Shipping Law and Practice | මාස 03 | ICLP Arbitration Centre |
| 02 | ඩබ්ලිව් එම් පි එස් කුමාරි මිය | ලේකම් | Secretarial Practices | 04 days | Skills Development Fund Ltd |
| 03 | ආර් පි රණවිර මිය<br>එල් පි ටයිටස් මහතා<br>බී ධර්මදාස මිය<br>ජි ඩි එස් ප්‍රියදර්ශිකා මිය<br>ජ් එම් ආර්ජ් වාන්දනි මිය | සහ.කළමණාකරු<br>සමුද්‍ර පරි.නිළධාරි<br>සමුද්‍ර පරි.නිළධාරි<br>එම<br>එම | පරිපාලන නිතිය හා මානව සම්පත් සංවර්ධනය | 01 days | ඉදිකිරිම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය |
| 04 | සියලුම සාමාජිකයින් | | Motivation and Attitudinal Changes | 01 days | Skills Development Fund Ltd |
| 05 | එච් ආර් ඩි සුභාෂිණි මිය | සමුද්‍රිය පරිසර නිළධාරි | Objective Oriented Project Planning | 04 days | ශ්‍රි ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 06 | අනිල් ශාන්ත මයා<br>දිසානායක මයා<br>ජ් එස් විජේසිංහ මයා<br>එන් ප්‍රනාන්දු මයා<br>එස් පුෂ්පකුමාර මයා | රියදුරු | ආරක්ෂිත විද්‍යාත්මක වාහන භාවිතය | 01 days | ඉදිකිරිම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය |
| 07 | එරන්ති ප්‍රනාන්දු මිය | සමුද්‍රිය පරිසර නිළධාරිනි | ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය | 01 days | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| 08 | ජි පි තිලංජනි මිය | පරිපාලන නිළධාරිනි | විනය කාර්යය පටිපාටිය | 02 days | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| 09 | නිතිඥ ආර් එස් ආරියප්පෙරුම මයා<br>ඩබ්ලිව් එන් දියබලනගේ | සභාපති<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | Seminar on Improving Performance through Good Governance and the rule of Law | 01 days | Skills Development Fund Ltd |
| 10 | ඩබ්ලිව් එන් දියබලනගේ මයා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | Workshop on Environment Management | 04 days | ශ්‍රි ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 11 | එස් ඩි ජි පි සමරවිර මිය | කළමණාකාර සහකාර | Diploma in Communication Skills in English | මාස 15 | මිලෝදා ආයතනය |

***2011 වර්ෂය තුල සහභාගි වූ විදේශීය පුහුණු වැඩසටහන්***

| අනු අංකය | නම | තනතුර | පාඨමාලාවේ නම | කාලය | ආයතනයේ නම |
|---|---|---|---|---|---|
| 01 | ජ් එම් ආර් චාන්දනි මිය | සමුද්‍රිය පරිසර නිළධාරිනි | Beyond Climate Change Impacts on Water Resources , Biodiversity Communication the Role of Society | 2011.06.06 – 2011.06.24 | තායිලන්තය |
| 02 | නිතිඥආර් එස් ආරියප්පෙරුම මයා<br>රියර් අද්මිරාල් එස් ආර් සමරතුංග | සභාපති<br>සාමාන්‍යාධිකාරි | Oil Spill Response Information Session | 2011.06.19 – 2011.06.22 | ඉන්දියාව |
| 03 | නිතිඥ ආර් එස් ආරියප්පෙරුම මයා | සභාපති | 62nd Session of the Marine Environment Protection Committee | 2011.07.11 – 2011.07.15 | එංගලන්තය |
| 04 | ටි එස් රණසිංහ මිය | සහකාර කළමණාකාරිණි (බස්නාහිර) | Seminar on Environment Protection and Management for Officials from Developing Countries | 2011.08.08 – 2011.08.19 | චිනය |
| 05 | නිතිඥ ආර් එස් ආරියප්පෙරුම මයා | සභාපති | Executive Management Meeting for Environmental Agencies and National Nuclear Institutes | 2011.08.08 – 2011.08.12 | පිලිපිනය |
| 06 | රියර් අද්මිරාල් එස් ආර් සමරතුංග | සාමාන්‍යාධිකාරි | Regional Workshop on IMO London Protocol | 2011.08.24 2011.08.26 | තායිලන්තය |
| 07 | එරන්ති ප්‍රනාන්දු මිය | සමුද්‍රිය පරිසර නිළධාරි | Sub Regional Workshop to address GHG emissions from International Shipping | 2011.11.15 2011.11.16 | සිංගප්පූරුව |

## 3.3 අභ්‍යන්තර විගණන අංශය

මෙම අධිකාරියේ සභාපතිගේ මගපෙන්වීම හා සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කොට ක්‍රියාත්මක වේ. මෙම විගණන අංශය විසින් ප්‍රධාන වශයෙන් ආයතනයේ මූල්‍ය, මෙහෙයුම්, පරිපාලන හා නීති යන අංශයන්හී ඵලදායී ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නිරීක්ෂණයන් පවත්වා එම වාර්තා සභාපතිගේ අවධානය හා තීරණ ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතුය.

එහිදී පහත කර්තව්‍යයන් අදාළ කර ගනු ලැබේ.

- ආයතනයේ මූල්‍ය හා අභ්‍යන්තර පාලනය සමාලෝචනය කිරීම.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු සමාලෝචනය කිරීම. මෙහිදී මෙම තොරතුරු සම්බන්ධ ක්‍රියාදාමය මූලික වශයෙන් තක්සේරු කිරීමකට භාජනය කර අදාළ තොරතුරු වාර්තා කිරීම හා එක් එක් විශේෂ අවස්ථා සම්බන්ධව විශේෂ විමර්ශන පැවැත්වීම හා වාර්තා කිරීම.
- මූල්‍ය හා මූල්‍ය නොවන පාලන ක්‍රමයන්හී ආර්ථික ඵලදායීභාවය හා කාර්යක්ෂමතාවය විමර්ශනය.
- රාජ්‍ය නීති රීති හා ආයතනික අභ්‍යන්තර නීති රීති පද්ධතීන්හි අනුකූලතාවයන් විමර්ශනය.
- කළමණාකරණයේ අවශ්‍යතාවය පරිදි එක් එක් හදිසි තත්ත්ව සම්බන්ධයෙන් හදිසි විමර්ශන පැවැත්වීම.

ඒ අනුව වසර තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් සකස්කළ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම හා අභ්‍යන්තර විගණන වැඩසටහන මත පදනම්ව අධිකාරියේ සියළුම අංශ හා ප්‍රාදේශිය කාර්යාල විගණනයට ලක්කළ අතර විගණනය සම්බන්ධයෙන් තොරතුරු විගණන වාර්තා වශයෙන් මාසිකව සභාපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

එසේම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් හතරක් 2011 වර්ෂයේදි පැවැත්වූ අතර එම රැස්වීමේ වාර්තා කාර්යක්ෂම හා ඵලදායි තීරණ ගැනීම සඳහා සභාපති හා සාමාන්‍යාධිකාරි වෙත ඉදිරිපත් කර ඇත.

## 3.4 නීති අංශය

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිති අංශය අධිකාරියේ සියළුම නෛතික කටයුතු කළමණාකරනය සිදුකරනු ලබයි. 2011 වසරේදි අධිකාරියේ නිති අංශය විසින් සිදුකරන ලදි ක්‍රියාකාරකම් පහත දැක්වේ.

මෙම අධිකාරියේ නිති අංශය 2011 අංක 01 දරන ඛනිජ තෙල් ඇතුලු ස්වාභාවික සම්පත් සදහා අක්වෙරළ කැනීම් හා ප්‍රයෝජනයට ගැනීමේ (සමුද්‍රය පරිසර ආරක්ෂණ) නියෝග සකස්කර එකී කැණීම් කටයුතු "කේන්ස් ලංකා ලිමිටඩ්" නැමති ඉන්දියානු සමාගමක් විසින් 2011 අගෝස්තු මස මන්නාරම් ද්‍රෝණියේ ආරම්භ කිරිමට පෙර, එම නියෝග ගැසට් කිරිමට කටයුතු කරන ලදි. මෙය මෙම අධිකාරියට ආදායම් ඉපයීමේ මාර්ගයක්ද වේ.

01 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතෙහි 51 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව නියෝග දහයක (10) කෙටුම්පත් නීති සම්පාදනය කරන අතර එකී නීති කෙටුම්පත් සම්පාදක වෙත භාර දෙන ලදි.

02 ආයතනයේ අවශ්‍යතාවන්හි ප්‍රමුඛතා අනුපිළිවල අනුව කටයුතු කරමින් 2011 අංක 02 දරන බංකරින් (සමුද්‍රය පරිසර ආරක්ෂණ) නියෝගය හා 2012 අංක 01 දරන "තෙල් උතුරායාම පිළිබද හදිසි සැලැස්ම නියෝග" යන නියෝග ලබන වසරේ මුල් කාර්තුව තුළදී ගැසට් කිරිමට හැකිවන පරිදි සාකච්ජා වට ගණනාවක් පවත්වන ලදි.

**03** පානදුර වරායෙන් ඔබ්බෙහි මුහුදේ නැංගුරම් ලා ඇති සයිප්‍රස් දේශයේ ධජය දරණ නැවක් පිළිබද ලැබුණු තොරතුරු අනුව ක්‍රියාත්මක වෙමින් වසර 5 ක් මුළුල්ලේ කිසිදු නඩත්තුවකින් තොරව නැංගුරම් ලා තිබීම නිසා ඉතාම අබලන් තත්වයට පත්විම හේතුවෙන් බටහිර සිට දකුණු දිග දක්වා වන, සංචාරකව්‍යාපාරය සම්බන්ධයෙන් අතිශයින්ම වැදගත් වන වෙරළ තීරයට විය හැකි බලවත් පරිසර දූෂණයේ දැඩි අවදානම සැලකිල්ලට ගනිමින් මෙම අධිකාරියේ නීති නිලධාරිනිය මගින් කොළඹ වාණිජ මහාධිකරණයට වාචික දේශන ඉදිරිපත් කරන ලදි.අනතුරුව අදාල පනතේ මෙම අධිකාරියට පවරා ඇති ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරමින් සමුද්‍ර පරිසරයට සිදු විය හැකි දූෂණය වැලැක්වීමට ගත හැකි සියලු පියවර ගන්නා ලදි.

04 මෙම අධිකාරියෙහි නීතිමය බලතල පිළිබදව මහජනතාව දැනුවත් කිරිමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් නීති නිලධාරිනිය විසින් ආයතනයේ මෙහෙයුම් අංශය සහ ශාඛා කාර්යාල මගින් සංවිධානය කර ඇති වැඩමුළු වලදී දැනුවත් කිරිමේ දේශන ගණනාවක් පවත්වන ලදි.

## 3.5 මූල්‍ය අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය අංශය එහි මූල්‍ය කළමණාකරන කටයුතු සඳහා වගකීම දරනු ලබයි. සමස්ථයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කෙරෙහි බලපානු ලබන සියලුම ආර්ථික හා මූල්‍යමය කාරණා සම්බන්ධයෙන් මූල්‍ය සම්පත් ස්ථානගත කිරීම හා සියලුම අරමුණු සඳහා සම්පත් බෙදාහැරීම සිදුකරනු ලබයි. කාර්යක්ෂමවත් ඵලදායි ලෙසත් අධිකාරියේ මූල්‍ය සේවා සැපයීමත් ඒ සඳහා මගපෙන්වීම් සිදුකිරීමත් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා පසුවිපරම් කිරීම මගින් අධිකාරියේ මූල්‍ය සම්පත් පාලනය කිරීම මූල්‍ය අංශයේ මූලික අරමුණ වේ.

**ක්‍රියාකාරකම්**

1 වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැපයීම
2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
3 මූල්‍ය ප්‍රකාශන වාර්තා හා මාසික අයවැය පිළිබඳ වාර්තා සැපයීම
4 වැටුප් හා වේතන සඳහා වූ වාර්තා තැබීම හා ගෙවීම් කිරීම
5 ව්‍යාපෘති සක්‍රියව පවත්වාගෙන යාම
6 සියලුම ගෙවීම් කටයුතු
7 ණය හා අත්තිකාරම් සම්බන්ධ වන ගිණුම් තැබීමේ කටයුතු
8 බැංකු සමග සම්බන්ධීකරණය
9 විගණකාධිපති දෙපාර්මේන්තුව සමග සම්බන්ධීකරණය
10 ආයෝජන කළමණාකරනය හා අනෙකුත් කටයුතු

**වසර තුලදී සිදුකරන ලද විශේෂිත ක්‍රියාකාරකම්**

01 2011 වසර තුලදී සේවකයන් සඳහා මාස 12ක වැටුප් මුදලක් ලබාදීමට ණය ක්‍රමයක් ආරම්භ කල අතර වසර අවසාන වන විට සේවකයන් 24 දෙනෙකු සඳහා රු 4,939,000 මුදලක් මෙම ණය ක්‍රමය යටතේ ලබාගෙන ඇත.

02 වසර තුලදී අධිකාරිය විසින් ජංගම ගිණුමේ ඉතිරිව පවතින ශේෂයන් එක්දින ඉල්ලුම් තැන්පතුවල ආයෝජනය කිරීම ආරම්භ කල අතර එමගින් වසර තුලදී රු 207,403.15 පොලී ආදායමක් උපයාගැනීමට හැකිවිය.

03 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතේ අධිකාරිය විසින් වෙනම අරමුදලක් ආරම්භ කල යුතුය. ඒ අනුව අධිකාරිය විසින් 2010 වසරේ දඩ මුදල් ලෙස අයකරගනු ලැබූ රුපියල් මිලියන 10 ක මුදල එම ගිණුම සඳහා මාරුකරන තෙක් භාණ්ඩාගාර බිල්පත් වල අයෝජනය කල අතර 2011.12.31 දිනට අරමුදලේ ශේෂය පහත පරිදි වේ.

| ආයෝජන වටිනාකම | පොලිය | මුලු වටිනාකම 31.12.2011 |
|---|---|---|
| 9,999,999.75 | 709,914.25 | 10,709,914.00 |

04 අධිකාරියේ ඉල්ලීම මත වසර තුලදී ප්‍රදානයන් ලෙස ඩබල්කැබ් රථ 2 ක් ලැබීමද වසර තුලදී මූල්‍ය අංශය ලැබූ විශේෂ ජයග්‍රහනයක් වේ.


## 5 ආදායම්

**අධිකාරියේ ආදායම් විශ්ලේෂණය 2005 සිට 2011 දක්වා**

2010 වසරට සාපේක්ෂව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2011 වර්ෂයේ 125% කින් ආදායම වැඩිකර ගැනීමට හැකිවී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත කරුණු බලපාන ලදි.

1 බලපත්‍ර ගාස්තු රු 3000 සිට රු4000 දක්වා වැඩිකිරීම.
2 තෙල් ගවේශන කටයුතු සඳහා පරිසර ඇගයීම් බලපත්‍ර නිකුත් කිරීම.
3 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැපයීම සඳහා ලැබූ නෞකා සංඛ්‍යාව වැඩිවීම මේ සඳහා බලපාන ලදි.

**2005 වසරේ සිට 2011 වසර දක්වා**
**අධිකාරියේ ආදායම් වර්ධනය**



### 3.5.6 මූල්‍ය ප්‍රගති වාර්තාව – 2011 වර්ෂය සඳහා - පුනරාවර්තන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2011 | 2011.12.31 දිනට සත්‍ය වියදම | 2011.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | **පුනරාවර්ථන වියදම්** | | | |
| | **පුද්ගල පඩිනඩි** | | | |
| 1001 | වැටුප් හා වේතන | 35,377,000.00 | 27,951,854.45 | 7,425 ,145.55 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000.00 | 510,158.75 | 489,841.25 |
| 1003 | වෙනත් දීමනා | 520,000.00 | 324,350.00 | 195,650.00 |
| | **මුළු එකතුව** | **36,897,000.00** | **28,786,363.20** | **8,110 ,636.80** |
| | **ගමන් වියදම්** | | | |
| 1101 | දේශීය | 1,400,000.00 | 1,129,619.44 | 270,380.56 |
| 1102 | විදේශීය | 1,270,000.00 | 1,048,923.61 | 221,076.39 |
| | **මුළු එකතුව** | **2,670,000.00** | **2,178,543.05** | **491,456.95** |
| | **සැපයීම්** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 660,000.00 | 493,150.46 | 166,849.54 |
| 1202 | ඉන්ධන | 1,300,000.00 | 817,535.50 | 482,464.50 |
| 1205 | වෙනත් | 300,000.00 | 143,608.00 | 156,392.00 |
| | **මුළු එකතුව** | **2,260,000.00** | **1,454,293.96** | **805,706.04** |
| | **නඩත්තු වියදම්** | | | |
| 1301 | වාහන | 1,275,000.00 | 870,473.94 | 404,526.06 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රොපකරණ | 725,000.00 | 498,326.22 | 226,673.78 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 300,000.00 | 54,209.00 | 245,791.00 |
| | **මුළු එකතුව** | **2,300,000.00** | **1,423,009.16** | **631,199.84** |
| | **සේවා** | | | |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 963,000.00 | 709,513.70 | 253,486.30 |
| 1403 | විදුලිය සහ ජලය | 1,450,000.00 | 1,251,219.97 | 198,780.03 |
| 1404 | බදු කුලී සහ පළාත් ආයතන බදු | 6,660,000.00 | 5,921,005.00 | 738,995.00 |
| 1405 | වෙනත් පුනරාවර්තන වියදම් | 2,050,000.00 | 1,748,237.84 | 301,762.16 |
| | **මුළු එකතුව** | **11,123,000.00** | **9,629,976.51** | **1,493,023.49** |
| | **පුනරාවර්ථන වියදම් එකතුව** | **55,250,000.00** | **43,472,185.88** | **11,532,023.12** |

## 3.5.7 මූල්‍ය ප්‍රගති වාර්තාව – 2011 වර්ෂය සඳහා - ප්‍රාග්ධන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2011 | 2011.12.31 දිනට සත්‍ය වියදම | 2011.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 22,157.14 | 477,842.86 |
| 2002 | පිරියත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 312,902.89 | 187,097.11 |
| 2003 | වාහන | 1,000,000.00 | 645,878.93 | 354,121.07 |
| | **එකතුව** | **2,000,000.00** | **980,938.96** | **1,019,061.04** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2101 | වාහන | - | - | |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,000,000.00 | 927,700.28 | 72,299.72 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රොපකරණ | 2,000,000.00 | 1,655,640.00 | 344,360.00 |
| | **එකතුව** | **3,000,000.00** | **2,583,340.28** | **416,659.72** |
| 2502 | අනෙකුත් ප්‍රාග්ධනය | | | |
| | 1 NOSCOP–ධාරිතා වර්ධන | 6,200,000.00 | 3,943,929.48 | 2,254,070.52 |
| | 2 අන්තර්ජාතික නීති රෙගුලාසි හා සම්මුතින් | 300,000.00 | 180,115.00 | 119,885.00 |
| | 3 පාසැල් සමුද්‍ර කණ්ඩායම් වැඩසටහන් | 2,550,000.00 | 2,066,698.34 | 483,301.66 |
| | 4 දැනුවත් කිරීමේ වැඩසටහන් | 250,000.00 | 326,656.64 | (76,656.64) |
| | 5 සොඳුරු සයුර¨ වැඩසටහන් | 5,250,000.00 | 5,521,563.02 | (271,563.02) |
| | 6 ධීවර කටයුතු ආශ්‍රිත සමුද්‍ර දූෂණය වැලැක්වීම | 5,550,000.00 | 1,238,666.71 | 4,261,333.29 |
| | 7 ජල තත්ත්ව පරික්ෂණ වැඩසටහන් | 2,100,000.00 | 1,809,679.00 | 290,321.00 |
| | 8 විද්‍යාගාර සංවර්ධනය කිරීම | 1,500,000.00 | 1,414,802.13 | 85, 197.87 |
| | 9 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් | 600,000.00 | 854 ,666.44 | (254, 666.44) |
| | 10 ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් | 2,500,000.00 | 2,045,970.00 | 454, 030.00 |
| | 11 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන | 650,000.00 | 439,380.00 | 210,620.00 |
| | 12 පුබුදමු ගම්පහ වැඩසටහන | 1,200,000.00 | 500,245.00 | 699,755.00 |
| | 13 සමුද්‍ර පර්යේෂණ වැඩසටහන් | 400,000.00 | 273,497.34 | 126,502.66 |
| | 12 මානව සම්පත් සංවර්ධනය | 1,000,000.00 | 931,896.52 | 68,103.48 |
| | **එකතුව** | **30,000,000.00** | **21,547,765.62** | **8452,234.00** |
| | **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **35,000,000.00** | **25,112,044.86** | **9,887,954.76** |

# 4.1.ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 4.1.1සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන 2011 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ගිණුම් කෙරෙහි බලපාන උද්ධමන සඳහා ගැලපීම් සිදු කර නොමැත.

ආදායම් සහ වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇති අතර හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම ගිණුම්වල සිදුකර ඇත.

## 4.1.2 මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පදනම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ.මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කොට ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශය සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත 2011 සිට බලාත්මක වුවද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් එම ප්‍රමිත 2010 සිට බලාත්මක වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය අංශ ප්‍රමිත නිකුත් කොට නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කර ඇත.

## 4.1.3 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය මත, ඒවා භාවිතා කරන අරමුණ සඳහා යොදාගන්නා අවස්ථාවේ සිට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සිදුකරනු ලබයි. ක්ෂය කිරීම සඳහා භාවිතා කරන ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| වත්කම | ක්ෂය ප්‍රතිශතය |
|---|---|
| මෝටර් රථ | 20% |
| පරිගණක ආශ්‍රිත උපකරණ | 15% |
| අනෙකුත් කාර්යාල උපකරණ | 15% |
| දුරකථන | 15% |
| ජංගම දුරකථන | 10% |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ | 10% |
| පිටත සවිකරණ එන්ජිම | 20% |
| පාවෙන රබර් යාත්‍රාව | 20% |
| කන්ටේරනයක ස්ථාපිත කරන ලද කාර්යාලය | 20% |

මෙම අධිකාරිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව දේපල, පිරියත හා උපකරණ සඳහා ගිණුම් තැබීම සිදුකරයි.

## 4.1.4 ආදායම

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ප්‍රදාන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. මෙයට අමතරව, ශ්‍රී ලංකාවට පැමිණෙන නැව්වල අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන කටයුතු ආශ්‍රිතව නිකුත් කරන බලපත්‍රවලින්, තෙල් ගවේශන කටයුතු වලින් අධිකාරිය විසින් ආදායම් ඉපයීම සිදුකරනු ලබයි.

### 4.1.4.1 අධිකාරිය මගින් ජනනය කරනු ලබන ආදායම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව අධිකාරිය මගින් ජනනය කරනු ලබන ආදායම උපචිත පදනම මත ගණනය කරනු ලබයි .

### 4.1.4.2 ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ප්‍රදාන

අධිකාරියට ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස වර්ග දෙකක ප්‍රදාන ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 පදනම් කොටගෙන මෙම ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය පහත දැක්වේ.

### 4.1.4.3 ප්‍රාග්ධන ප්‍රදාන

දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම හෝ ඒ ආශ්‍රිත කටයුතු සඳහා ලැබෙන රජයේ ප්‍රදාන, එම දේපලවල ප්‍රයෝජනවත් කාලසීමාව තුළ ආදායම හැටියට ගණනය කරනු ලබයි. ශ්‍රී ලංකාව වටා සිදුවිය හැකි සමුද්‍ර දූෂණය වැලැක්වීම ආශ්‍රිත කටයුතු සඳහා ලැබෙන ප්‍රදාන, අස්පෘශ්‍ය වත්කම් නිර්මාණය කිරීම සිදුවුවද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 37 දක්වා ඇති වත්කම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සම්පූර්ණ වීමක් සිදුනොවන බැවින් සමුද්‍ර දූෂණ වැලැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා දරනු ලබන වියදම් සඳහා ප්‍රදාන අදාල ක්‍රියාකාරකම සිදුකරනු ලැබූ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීම සිදුකරනු ලබයි.

### 4.1.4.4 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන ඒවා ලැබෙන වර්ෂය තුළ ආදායම් හැටියට ගණනය කරනු ලැබේ. එයට හේතුව නම් එම වියදම අදාල වර්ෂය තුළම දැරීමට සිදු වීමයි.

## 4.1.5 වියදම

උපචිත පදනම මත වියදම් ගණනය කරනු ලැබේ.

## 4.1.6 පාරිතෝෂිත සඳහා වෙන්කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 අනුව, සේවකයන් විශ්‍රාම යන විට පාරිතෝෂිත ගෙවීම සඳහා වෙන්කිරීම වාර්ෂිකව සිදුකරනු ලබයි.

# 4.2 මූල්‍ය තත්ව ප්‍රකාශය

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | පටහන | 2011 රු | 2010 රු |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| ණයගැතියෝ | 11 | 16,935.00 | 98,437.49 |
| තැන්පතු | 12 | 1,137,800.00 | 480,800.00 |
| ඉදිරියට කල ගෙවීම් | 13 | 370,250.73 | 533,538.35 |
| සේවක ණය | 14 | 6,257,776.56 | 3,929,914.76 |
| කෙටිකාලීන ආයෝජන(භාණ්ඩාගාර බිල්පත්) | | 10,709,913.55 | 9,999,999.75 |
| මුදල් ශේෂය | 10 | 13,619,138.16 | 7,069,591.12 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 09 | 39,814,309.96 | 22,359,481.89 |
| **මුළු වත්කම්** | | **71,926,123.96** | **44,471,763.35** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත ගෙවීම් | 15 | 10,837,615.91 | 273,840.48 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සමුද්‍ර පරිසර ආරක්ෂණ අරමුදල | 20 | 12,309,913.55 | 11,600,000.00 |
| ආපදා ණය සඳහා මුදල | 16 | 6,389,200.68 | 6,204,711.22 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 17 | 3,756,087.50 | 2,866,922.50 |
| **මුළු වගකීම්** | | **33,292,817.64** | **20,945,474.20** |
| **ශුද්ධ වත්කම්** | | **38,633,306.31** | **23,526,289.15** |
| **හිමිකම්** | | | |
| රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධනය(විලම්බිත ප්‍රදාන) | 18 | 39,814,311.09 | 22,359,482.03 |
| උපචිත හිගය/අතිරික්තය | 19 | (1,181,004.78) | 1,166,807.12 |
| **මුළු හිමිකම්** | | **38,633,306.32** | **23,526,289.15** |

# 4.3 මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| **ආදායම** | සටහන | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 1 | 53,327,215.80 | 48,164,438.86 |
| ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තු | 2 | 9,242,201.03 | 4,438,000.00 |
| වෙනත් ආදායම් | 3 | 969,145.95 | 380,304.19 |
| **මුළු ආදායම** | | **63,538,562.78** | **52,982,743.05** |
| **වියදම්** | | | |
| වැටුප් හා වේතන ගෙවීම් | 4 | 29,670,533.99 | 26,341,796.16 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 5 | 2,852,673.76 | 2,398,219.34 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6 | 11,975,763.90 | 9,554,829.06 |
| ප්‍රදාන හා මාරු කිරීම් | 7 | 13,031,810.11 | 11,000,148.32 |
| මූල්‍ය වියදම් | 8 | 40,142.30 | 20,195.00 |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම | 9 | 5,825,405.76 | 3,713,425.21 |
| **මුළු වියදම** | | **63,396,329.82** | **53,028,613.09** |
| කාලපරිච්ඡේදය සඳහා<br>ඌණතාවය/ අතිරික්තය | | 142,232.96 | (45,870.04 ) |

# 4.4 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**
**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත හිගය/ අතිරික්තය | එකතුව |
|---|---|---|---|
| 2010/12/31 දිනට ශේෂය | 22,359,482.03 | 1,166,807.12 | 23,526,289.14 |
| ප්‍රාග්ධන ප්‍රදාන වලට මාරු කිරිම | - | (2,490,044.86) | – |
| 2010.01.01 දිනට ගලපන ලද ශේෂය | 22,359,482.03 | (1,323,237.74) | 21,036,244.29 |
| ප්‍රාග්ධන අරමුදල් ලැබීම් | 36,312,044.86 | - | 36,312,044.86 |
| ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට මාරු කිරිම (SLAS 24) | (18,857,215.80) | - | (18,857,215.80) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌණතාවය | - | 142, 232.96 | 142, 232.96 |
| 2011/12/31 දිනට ශේෂය | 39,814,311.09 | (1,181,004.78) | 38,633,306.31 |

# 4.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2011 වසර සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය | 142,232.96 | (45,870.04) |
| **ගැලපුම් කිරීම** | | |
| වර්ෂය සඳහා ක්ෂය වෙන්කිරීම | 5,825,405.76 | 3,713,425.21 |
| ආරම්භක ශේෂයට ගැලපුම් | 2,490,044.86 | 30,000.00 |
| අත්තිකාරම් වියදමට මාරු කිරීම | 84,937.50 | - |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 889,165.00 | 602,947.50 |
| SLAS 24 අනුව හඳුනාගත් ආදායම (ඉකුත් වර්ෂවලින් ලද ප්‍රදානයන්ගෙන්) | (18,857,215.80) | (14,713,573.46) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය / ඌනතාවය | (9,425,429.72) | (10,413,070.79) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තැන්පතු (අඩුවීම/වැඩිවීම) | (657,000.00) | (105,000.00) |
| පෙර ගෙවුම් (අඩුවීම/වැඩිවීම) | 163,287.62 | (148,806.31) |
| ණයගැතියන්ගේ (අඩුවීම/වැඩිවීම) | (3,435.00) | (76,225.24) |
| ජංගම බැරකම්වල (අඩුවීම/වැඩිවීම) | 10,563,775.43 | (61,729.15) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 641,198.33 | (10,804,831.49) |
| **ආයෝජන කටයුතු** | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | (10,709,913.55) | (9,999,999.75) |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (4,570,279.08) | (8,021,851.68) |
| කාර්යමණ්ඩල ණයෙන් ලද ණය පොලිය | 184,489.46 | 106,568.01 |
| | 709,913.55 | - |
| කාලපරිච්ඡේදයේ කාර්යමණ්ඩල ණය (අඩුවීම/වැඩිවීම) | (2,327,861.80) | (1,871,062.02) |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ ජනනය වූ මුදල් ප්‍රවාහය | (16,713,651.42) | (19,786,345.44) |
| **මූල්‍යන කටයුතු** | | |
| MT GRANBA සිද්ධියෙන් ලද මුදල් | | 15,600,000.00 |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 22,622,000.00 | 19,022,000.00 |
| මූල්‍යය කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 22,622,000.00 | 34,622,000.00 |
| කාලපරිච්ඡේදය තුළ මුදල් හා මුදල්වලට සමාන දෑවල ශුද්ධ අඩුවීම/වැඩිවීම | 6,549,546.91 | 4,030,823.07 |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ | 7,069,591.10 | 3,038,768.03 |
| වසර අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ | 13,619,138.01 | 7,069,591.10 |

# 4.6 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| සටහන 01 | භාණ්ඩාගාරයේ ප්‍රදාන | |
|---|---|---|
| **භාණ්ඩාගාරයේ ප්‍රදාන** | **2011** | **2010** |
| පුනරාවර්තන ප්‍රදාන | 34,470,000.00 | 33,280,000.00 |
| ආදායම ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරිම– මුදල ශේෂය | - | 170,865.40 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව– ප්‍රවර්තන වර්ෂය | 13,031,810.11 | 11,000,148.32 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව –විලම්බිත ප්‍රධාන | 5,825,405.69 | 3,713,425.14 |
| | 53,327,215.80 | 48,164,438.86 |

| සටහන 02 | ගාස්තු, දඩ මුදල් හා බලපත්‍ර ගාස්තු | |
|---|---|---|
| **අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන ගාස්තු** | **2011** | **2010** |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය – ලියාපදිංචි ගාස්තු | 2,040,500.00 | 2,195,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය – බලපත්‍ර ගාස්තු | 3,839,000.00 | 2,215,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය – ඉල්ලුම්පත්‍ර ගාස්තු | 9,000.00 | 13,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය – ලියාපදිංචි ගාස්තු (2011 වෙනුවෙන් 2010 වසර තුළ ලැබිම්) | 31,000.00 | 15,000.00 |
| ස්වභාවික සම්පත් නිස්සාරණය– බලපත්‍ර ගාස්තු | 3,289,803.00 | - |
| ස්වභාවික සම්පත් නිස්සාරණය– ඉල්ලුම්පත්‍ර ගාස්තු | 32,898.03 | - |
| | 9,242,201.03 | 4,438,000.00 |

| සටහන 03 | වෙනත් ආදායම් | |
|---|---|---|
| **වෙනත් ආදායම්** | **2011** | **2010** |
| වෙනත් ආදායම් | 748,500.00 | 377,150.00 |
| පොත් අත්තිකාරම් පොලිය | 3,117.80 | 3,154.19 |
| චෙක්පත් අවලංගු කිරිම | 10,125.00 | - |
| පොලි ආදායම් | 207,403.15 | - |
| | 969,145.95 | 380,304.19 |

| සටහන 04 | වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ ගෙවීම් | |
|---|---|---|
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ ගෙවීම් | 2011 | 2010 |
| වැටුප් සහ වේතන | 27,951,854.45 | 25,196,278.83 |
| අතිකාල / නිවාඩු දින ගෙවීම් | 488,814.54 | 469,969.83 |
| වෙනත් දීමනා | 340,700.00 | 72,600.00 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | 889,165.00 | 602,947.50 |
| | | |

| සටහන 05 | සැපයුම් හා භාවිතාකල පාරිභෝජන භාණ්ඩ | |
|---|---|---|
| **5.01 සැපයුම්** | **2011** | **2010** |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 493,150.46 | 348,135.99 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 817,535.50 | 644,411.85 |
| නිල ඇඳුම් | 143,608.00 | 44,440.00 |
| | **1,454,293.96** | **1,036,987.84** |
| **5.02 නඩත්තු වියදම්** | | |
| වාහන නඩත්තු වියදම් | 870,473.94 | 838,648.34 |
| පිරියත, යන්ත්‍ර සහ උපකරණ නඩත්තු වියදම් | 473,696.86 | 383,522.16 |
| කාර්යාල නඩත්තු වියදම් | 54,209.00 | 139,061.00 |
| | **1,398,379.80** | **1,361,231.50** |

| සටහන 06 | වෙනත් පුනරාවර්තන වියදම් | |
|---|---|---|
| **6.01 ගමන් වියදම්** | **2011** | **2010** |
| දේශීය ගමන් වියදම් | 1,116,257.86 | 951,853.55 |
| විදේශීය ගමන් වියදම් | 1,048,923.61 | 350,524.88 |
| | **2,165,181.47** | 1,302,378.48 |
| **6.02 ගිවිසුම්ගත සේවා** | | |
| විදුලි සංදේශ / තැපැල් ගාස්තු | 716,585.48 | 679,632.53 |
| විදුලි බලය සහ ජල වියදම් | 1,342,482.69 | 1,080,061.82 |
| කාර්යාල කුලී | 5,932,135.00 | 5,794,435.00 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 1,656,091.49 | 847,127.59 |
| 2011 වසර සඳහා ඉකුත් වසර තුළ පෙර ගෙවුම් | 533,538.35 | 384,732.04 |
| 2012 වසර සඳහා 2011 වසර තුළ පෙර ගෙවුම් | (370,250.58) | (533,538.35) |
| | 9,810,582.43 | **8,252,450.63** |

| සටහන 07 | ප්‍රධාන හා අනෙකුත් මාරුකිරීම් | |
|---|---|---|
| ප්‍රධාන හා අනෙකුත් මාරුකිරීම් | 2011 | 2010 |
| වසර සඳහා මුළු ප්‍රාග්ධන ප්‍රදානය | 36,312,044.86 | 19,022,000.00 |
| **අඩුකළා :** | | |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා යොදා ගත් ප්‍රදානය | (23,280,234.75) | (8,021,851.68) |
| වසර තුළ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරුකිරීම් | 13,031,810.11 | 11,000,148.32 |

| සටහන 08 | මූල්‍ය වියදම් | |
|---|---|---|
| **මූල්‍ය වියදම්** | 2011 | 2010 |
| බැංකු ගාස්තු | 40,142.30 | 20,195.00 |
| | 40,142.30 | 20,195.00 |

| සටහන 09 | දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් වර්ගය | පිරිවැය –2011 | | | පිරිවැය – 2011 | | | ලියාහල අගය |
| | 01.01.2011 | එකතු වීම | 31.12.2011 | 01.01.2011 | එකතු වීම | 31.12.2011 | |
| මෝටර් රථ | 14,614,892.63 | 11,200,000.00 | 25,814,892.63 | 8,920,532.63 | 3,089,538.67 | 12,010,071.30 | 13,804,821.33 |
| දැව භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 14,682,642.69 | 4,751,150.75 | 19,433,793.44 | 6,902,922.14 | 1,688,407.55 | 8,591,329.69 | 10,842,463.75 |
| තාක්ෂණික උපකරණ | 10,474,595.41 | 7,329,083.08 | 17,803,678.49 | 1,589,194.08 | 1,047,459.54 | 2,636,653.62 | 15,167,024.87 |
| එකතුව | **39,772,130.73** | **23,280,233.83** | **63,052,364.56** | **17,412,648.84** | **5,825,405.76** | **23,238,054.60** | **39,814,309.96** |

| සටහන 10 | මුදල් හා මුදල් වලට සමාන දෑ | |
|---|---|---|
| **මුදල් හා මුදල් වලට සමාන දෑ** | **2011** | **2010** |
| ලංකා බැංකුව–194109 | 13,487,714.04 | 4,794,794.66 |
| මහජන බැංකුව | 131,424.12 | 2274796.46 |
| | 13,619,138.16 | 7,069,591.12 |

| සටහන 11 | ණයගැතියෝ | |
|---|---|---|
| **ණයගැතියෝ** | 2011 | 2010 |
| ශෙහාන් කුරුනේරු–කුලී ගෙවීම් | 13,500.00 | 13,500.00 |
| පුනරාවර්තන අත්තිකාරම් | 3,435.00 | 84,937.49 |
| | 16,935.00 | 98,437.49 |

| සටහන 12 | තැන්පතු | |
|---|---|---|
| **තැන්පතු** | **2011** | **2010** |
| ආරම්භක තැන්පතු ශේෂය | 480,800 | |
| කුලී | 657,000.00 | 466,500.00 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | | 14,300.00 |
| | 1,137,800.00 | 480,800.00 |

| සටහන 13 | පෙර ගෙවුම් | |
|---|---|---|
| පෙර ගෙවුම් | **2011** | **2010** |
| ගෙවල් කුලී පෙර ගෙවුම් | 180,100.00 | 418,288.89 |
| රක්ෂණය පෙර ගෙවුම් | 153,254.90 | 84,222.21 |
| නඩත්තුව කටයුතු සඳහා පෙර ගෙවුම් | 4,656.90 | 29,349.47 |
| වෙනත් | 32,238.78 | 1,677.78 |
| | 370,250.58 | 533,538.35 |

| සටහන 14 | ආපසු අය කළ යුතු කාර්යමණ්ඩල ණය | |
|---|---|---|
| **ආපසු අය කළ යුතු කාර්යමණ්ඩල ණය** | 2011 | **2010** |
| 2011.01.01 දිනට ආරම්භක ණය ශේෂය | 3,929,914.76 | 2,058,852.74 |
| **එකතු කළා** : | | |
| වසර තුළ දුන් ණය | 4,939,000.00 | 3,400,000.00 |
| ආපසු අයකළ හැකි ප්‍රමාණය | 8,868,914.76 | 5,458,852.74 |
| **අඩුකළා** : | | |
| වසර තුළ අයකර ගත් ණය ප්‍රමාණය | 2,611,138.20 | 1,528,937.98 |
| 2011.12.31 දිනට ශේෂය | 6,257,776.56 | 3,929,914.76 |

| සටහන 15 | ජංගම බැරකම් | |
|---|---|---|
| **ජංගම බැරකම්** | **2011** | **2010** |
| ණයහිමියෝ | 10,534,736.45 | |
| 2011 සඳහා WRS ලැබීම් | 18,000.00 | 31,000.00 |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | 107,457.38 | 16,194.66 |
| ගෙවිය යුතු නිවාස කුලී | 11,130.00 | - |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 54,867.37 | 47,795.59 |
| ගෙවිය යුතු වෙනත් වියදම් | 111,424.71 | 178,850.23 |
| | 10,837,615.91 | 273,840.48 |

| සටහන 16 | කාර්මණ්ඩල ණය අරමුදල | |
|---|---|---|
| **කාර්මණ්ඩල ණය අරමුදල** | 2011 | **2010** |
| 2011.01.01 දිනට ආරම්භක ණය ශේෂය | 6,204,711.22 | 2,098,143.21 |
| **එකතු කළා :** | | |
| අතිරේක අරමුදල් ලැබීම | | 4,000,000.00 |
| වර්ෂය සඳහා පොලිය | 187,125.46 | 107,608.85 |
| **අඩුකළා :** | | |
| බැංකු ගාස්තු | 2,636.00 | 1,040.84 |
| 2011.12.31 දිනට ශේෂය | 6,389,200.68 | 6,204,711.22 |

| සටහන 17 | පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | |
|---|---|---|
| **පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්** | 2011 | **2010** |
| 2011.01.01 දිනට ආරම්භක ණය ශේෂය | 2,866,922.50 | 2,263,975.00 |
| **එකතු කළා :** | | |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 889,165.00 | 602,947.50 |
| 2011.12.31 දිනට ශේෂය | 3,756,087.50 | 2,866,922.50 |

| සටහන 18 | රජයේ ප්‍රධාන සහ ප්‍රාග්ධනය | |
|---|---|---|
| **රජයේ ප්‍රධාන සහ ප්‍රාග්ධනය** | 2011 | **2010** |
| 2011.01.01 දිනට ආරම්භක ශේෂය | 22,359,482.03 | 18,051,055.49 |
| **එකතු කළා :** | | |
| වසර තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | 36,312,044.86 | 19,022,000.00 |
| **අඩුකළා :** | | |
| ආදායම හැටියට සලකන ලදි (SLAS 24) | 18,857,215.80 | 14,713,573.46 |
| 2011.12.31 දිනට ශේෂය | 39,814,311.09 | 22,359,482.03 |

| සටහන 19 | සම්මුච්චිත හිගය | |
|---|---|---|
| **සම්මුච්චිත හිගය** | 2011 | **2010** |
| 2011.01.01 දිනට ආරම්භක ශේෂය | 1,166,807.12 | 1,182,677.16 |
| වැරදි නිවැරදි කිරීම් | | 30,000.00 |
| **එකතු කළා :** | | |
| විලම්භිත ආදායමට මාරු කිරීම් | (2,490,044.86) | |
| වර්ෂය සඳහා හිගය/ අතිරික්තය | 142,232.96 | (45,870.04) |
| 2011.12.31 දිනට ශේෂය | 1,181,004.78 | 1,166,807.12 |

| සටහන 20 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල | |
|---|---|---|
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල | 2011 | 2010 |
| 2011.01.01 දිනට ආරම්භක ශේෂය | 11,600,000.00 | - |
| MT ග්‍රැන්බා - අරමුදල් ලැබීම් | | 11,600,000.00 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 709,913.55 | |
| 2011.12.31 දිනට ශේෂය | 12,309,913.55 | 11,600,000.00 |

21 2010 නොවැම්බර් මාසයේදී අධිකාරිය විසින් මාස 6 දී කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන ලද රුපියල් මිලියන 10 ක මුදල වසර තුළදී කල් පිරීමට ලක් වූ අතර එමගින් රුපියල් **709,517.00** පොලිය වශයෙන් උපයා ගන්නා ලදී. එසේම මුල් මුදල හා පෙලී මුදල වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන ලදී.

**22** අධිකාරියේ ජංගම ගිණුමේ පවතින ශේෂයන් දිනය අවසානයේදී එක් දින ඉල්ලුම් පත් වල ආයෝජනය කිරීම වසර තුළදී ආරම්භ කරන ලද අතර එමගින් කාලපරිච්ජේදය අවසාන වන විට පොලිය ලෙස රුපියල් **207,403.15** උපයා ගෙන ඇත. මෙම පොලී ආදායම වසරේ මුළු ආදායමේ ඇතුලත්ව ඇත.

**23** වසර තුළදී තෙල් ගවේෂණ ක්‍රියාකාරකම් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම මගින් රුපියල් **3,322,701.03** උපයා ගන්නා ලද අතර එය බලපත්‍ර ආදායමේ ඇතුලත්ව ඇත.එසේම වසර තුළදී අධිකාරිය විසින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තුව රුපියල් **3000** සිට රුපියල් **4000** දක්වා වැඩිකිරීම නිසා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැපයීමට බලපත්‍ර නිකුත් කිරීමෙන් ජනනය වූ මුදල් ආදායම රුපියල් **3,390,000.00** දක්වා වැඩිකර ගැනීමට හැකි විය.

**24** වසර තුළදී අධිකාරිය විසින් රුපියල් **23,280,233.83** වටිනාකමක් සහිත ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සිදුකරන ලදී.මෙම වත්කම් අගය තුල භාණ්ඩාගාරයෙන් ප්‍රධානයක් ලෙස ලැබුනු රුපියල් 11,200,000.00 වටිනා ඩබල් කැබ් රථ දෙකක්ද ඇතුලත් වේ . මෙයට අතිරේකව අධිකාරිය විසින් තවත් රුපියල් 12,080,233.83 වටිනා වත්කම් අත්පත් කර ගන්නා ලදී.මෙම වත්කම් වලට කාර්යාල උපකරණ, විද්‍යාගාර උපකරණ, පරිගණක හා පරිගණක මෘදුකාංග, පිටත සවි කරන ලද බෝට්ටු එන්ජින් , රබර් වලින් නිමවන ලද පාවෙන යාත්‍රාවක්, කාර්යාලයක් ලෙස නිමවන ලද කන්ටේනරයක් ආදි ද්‍රව්‍ය ඇතුලත් වේ.කෙසේ වුවද ඉහත සඳහන් කරන ලද වත්කම් අතුරින් පහත වගුවේ දක්වා ඇති වත්කම් 2012 වර්ෂය මුලදී ලැබීම් නිසා ඒවා සඳහා ක්ෂය ගැලපීම් ඊට අනුරූපව සිදුකිරීමට කටයුතු කැරනු ලැබේ.පහත වගුවේ දක්වා ඇති වත්කම් වල අගය ජංගම වගකීම් වල ඇතුලත්ව ඇත.

| වත්කම් | වටිනාකම |
|---|---|
| සන්නිවේදන උපකරන | 339,240.00 |
| ඩෙස්ක්ටොප් පරිගණක | 639,200.00 |
| ෆැක්ස් යන්ත්‍රය | 94,080.00 |
| ෆැක්ස් යන්ත්‍රය | 38,932.45 |
| රබර් වලින නිමවන ලද පාවෙන යාත්‍රාව | 672,000.00 |
| බෝට්ටු එන්ජින් | 510,000.00 |
| ලැප් ටොප් පරිගණක | 1,275,000.00 |
| රසායනාගාර උපකරන | 3,030,384.00 |
| කාර්යාලයක් ලෙස නිමවන ලද කන්ටේනරය | 750,400.00 |

# 5. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ඊඑම්/අයි/එම්ඊපීඒ/එෆ්ඒ/2011
ඔබේ අංකය / உமது இல / No:
දිනය / திகதி / Date: 2012 අගෝස්තු 16 දින

සභාපති,
සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය

**සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 35 දරන සමුද්‍ර පරිසර දූෂණ ආරක්ෂණ පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2012 මැයි 22 දින නිකුත් කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම් වූ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල විය බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි සඳහන් නියමයන්ට අනුකූලව පාර්තෝෂික වෙන්කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාහන දෙකකට අදාළව වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු:159,241 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) නිලධරින් 32 දෙනෙකු සඳහා පාර්තෝෂික දීමනා වෙන්කිරීම් රු:296,742 ක් වැඩියෙන් ද නිලධාරීන් 13 දෙනෙකු සඳහා රු:110,791 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

#### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් ගිණුම් ශේෂ ලෙජර / උපලෙජර සමඟ නොසැසඳුනි.

| විස්තරය | ගිණුම් අනුව ශේෂය | ලෙජර / උපලෙජර අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| ගමන් වියදම් | 1,116,258 | 1,143,421 | 27,163 |
| වෙනත් වියදම් | 1,656,091 | 1,696,634 | 40,543 |

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවස්ථා 07 කට අයත් එකතු වටිනාකම රු:279,005,389 ක්වූ ශේෂයන් පිළිබඳව ලෙජර ගිණුම්, කාර්ය සාධන වාර්තා, භාණ්ඩ ලැබීම් තුන්ඩු යනාදී සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.5 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ. 757 | | | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/ 12 | (i) | 6.5.1 ඡේදය | 2011 වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | 6.5.3 ඡේදය | 2009 සහ 2010 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශ වලට අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.142,233 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපකව ඉකුත් වර්ෂයේ රු.45,870 ක් වූ ඌනතාවය සමග සැසදීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.188,103 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

3.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය තුල රජයේ ආධාර රු:5,162,777 කින් ද අධිකාරියේ ආදායම රු.5,393,043 කින්ද වැඩි වීම ඉහත වාසිදායක විචලනයට හේතු වී තිබුණි.

(අ) (i) අධිකාරිය විසින් 2011 වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු ගත ආදායම හා සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවයේ ලියාපදිංචි ගාස්තු රු:209,500 කින්ද බලපත්‍ර ගාස්තු රු:161,000 කින්ද ඉල්ලුම් පත්‍ර ගාස්තු රු:11,000 කින්ද අඩු වී තිබුණි.

(ii) ඇස්තමේන්තු ගත ආදායමට ඇතුලත් වූ තෙල් හුවමාරු හා වෙනත් (Bunkering හා Other ( Fine / Penalties ) යන ආදායම් දෙකෙහි සත්‍ය ආදායම ඉපයීම 100% කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ආදායම රු. මිලියන 9.2 ක් වූ අතර එය මුළු ආදායමෙන් 14.5 % කි. ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ආදායම රුපියල් මිලියන 4.8 ක් වූ අතර එය මුළු ආදායමින් 9% ක් විය.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **ක්‍රියාකාර් සැලැස්ම**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2011 වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්ම අනුව වර්ෂයේ මුළු ප්‍රතිපාදන මුදල රු:35,000,000 ක් වූ අතර වර්ෂයේ ප්‍රගති වාර්තා සටහන් වලට අනුව සත්‍ය වියදම රු:25,098,320 ක් විය.ඒ පිළිබඳ විගණනයේදී පහත සටහන් නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරකම් 8 ක් සඳහා ප්‍රතිපාදන මුදල ඉක්මවා රු:2,052,230 ක් වියදම් කර තිබුණි.

(ආ) ක්‍රියාකාරකම් 3 ක මුළු ප්‍රතිපාදන මුදල වූ රු:1,100,000 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) ක්‍රියාකාරකම් 8ක ප්‍රතිපාදන මුදලින් 50% ක් හෝ ඊට වඩා වැඩියෙන් ඉතිරි වී තිබුණි.මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් "2011 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 12.32 මෙම අධිකාරිය වෙත භාණ්ඩාගාරය විසින් නිදහස් කිරීමක් සිදු නොවූ බව" දන්වා තිබුණි.

(ඈ) ක්‍රියාකාර් සැලැස්ම තුළ වූ ක්‍රියාකාරකම් වල වගකීම පවරන ලද නිලධාරීන් නම් කර නොතිබුණි.

(ඉ) ජාත්‍යන්තර සම්මුතීන් අත්සන් කිරීමේ ("Signing International Conventions") ක්‍රියාකාරකම සඳහා 2010 වර්ෂයේ රු:30,000 ක්ද,2011වර්ෂයේ රු:450,000 ක්ද ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් මෙම ක්‍රියාකාරකම වර්ෂ 2 තුළදී ඉටුකර නොතිබුණි.

4.2 සේවක වැටුප් ණය

අධිකාරියට ලද ආදායමෙන් රදවා ගත් මුදල් වන රු: මිලියන 6.176 ක මුදලක් යොදවා ආරම්භ කරන ලද සේවකයන් සඳහා වූ වැටුප් ණය / ආපදා ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2011 වර්ෂය තුළ රු:4,939,000 ක් ණය ගෙවා තිබූ අතර එක් එක් නිලධාරියාට මාස 12 ක වැටුප, වැටුප් ණය ලෙස ගෙවා තිබුණි.2011 දෙසැම්බර් 31 දිනය වන විට එම ආමුදලින් ගෙවා තිබූ වැටුප් ණය ශේෂය රු: 6,257,776 ක් විය.

4.3 ජගත් සාගර දිනය සැමරීම

සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ජගත් සාගර දිනය 2011 ජුනි 08 දින පේටිලයිනර් හොටෙල්හිදී සැමරීම සඳහා පවත්වන ලද සැමරුම් උළෙල සඳහා අනුමත වැඩසටහන හා මූල්‍ය වියදම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර නොතිබුණි.

මේ සඳහා වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් වෙන්කළ මුදල රු: 600,000 ක් වුවත් සත්‍ය වියදම රු:1,234,351 ක් වූ අතර වෙන්කළ මුදල ඉක්මවා රු:634,351 ක් හෙවත් 106% ක් වියදම් කර තිබුණි. මෙම වියදම් දැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

මේ සඳහා මුද්‍රණය කරන ලද සත් සමුද්‍ර සඟරාවේ පිටපත් 1000 ක් සඳහා රු:183,000 ක් 2011 ජුනි 13 දින ගෙවා තිබූ අතර 2011 දෙසැම්බර් 29 වන විටත් බෙදානොහැර ඉතිරි වූ පොත් 165 ක් විය.

4.4 ගබඩා පාලනය

මු:වෙ:754 ප්‍රකාරව 2011 වර්ෂය අවසානයේ බඩු ලේඛණ පොත තුලනය කර නොතිබූ අතර වර්ෂය තුළ රු:6,035,071 ක භාණ්ඩ ගබඩාව වෙත ලැබී තිබූ නමුත් භාණ්ඩ ලැබීම් ඇන්ඩු නිකුත් කර නොතිබුණි.

4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

විද්‍යාගාරය සඳහා උපකරණ මිළදීගැනීම් පිළිබඳ නියදියක් පරීක්ෂාවේදී රු: 2,501,100 ක මිළදී ගැනීම් 2010 දෙසැම්බර් මාසය තුළ සිදුකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම උපකරණ වර්ෂයක කාලයක් කිසිදු කාර්යයකට උපයෝගී කරනොගෙන නිකරුණේ විද්‍යාගාරය තුළ තැන්පත්කර තිබුණි.තවද විද්‍යාගාරය තුළ පරීක්ෂණ 12 ක් සිදුකිරීමට සැලසුම්කර තිබුණද එම පරීක්ෂණ විගණන දින වන 2011 දෙසැම්බර් දක්වා සිදුකර නොතිබුණ අතර පරීක්ෂණ සඳහා මිළදීගත් උපකරණ මෙන්ම අමුද්‍රව්‍යද නිෂ්කාර්යව පැවතිබව විගණනයේදී නිරීක්ෂණය විය.

4.6 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්**

අංක පී.ඊ.ඩී /12 හා 2003 ජුනි 02 දිනැති භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව අධිකාරිය සතු වාහනයක් පරිසර අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණද අමාත්‍යාංශයේද එම වාහනය නොතිබුණි. එසේ වුවද මෙම වාහනයේ නඩත්තු කටයුතු සඳහා අධිකාරිය විසින් රු:31,184 ක් වැය කර තිබුණි.

4.7 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 143 ක් වූ අතර තනතුරු 03 ක් සඳහා මු:රෙ: 71 යටතේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තථ්‍ය කාර්ය මණ්ඩලය 107 ක් විය. 2011 වර්ෂයේදී තනතුරු 36 ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. වර්ෂය තුල නිලධාරීන් 21 දෙනෙක් බඳවාගෙන තිබුණි.

(ආ) 2009 අගෝස්තු 20 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 09/1483/360/049 හි පරිදි වාර්ෂික අවත් කිරීමට යටත්ව 2009 ඔක්තෝබර් 01 දින සිට 2013 මාර්තු 16 දින දක්වා අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාගේ සේවය වාර්ෂිකව අවත් කිරීම සිදුකළ යුතු වුවද එසේකර නොතිබුණි. 2010 ඔක්තෝබර් 01 දින සිට විගණන දිනය වූ 2011 දෙසැම්බර් 09 දින දක්වා විසරක කාලයක් සේවය දීර්ඝකිරීමක් නොමැතිව තනතුරෙහි රැඳී සිට වැටුප් වශයෙන් රු:668,310 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් " ලේකම්වරයාගේ ආවරණ අනුමැතිය සඳහා 2012 මැයි මසදී ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත." යනුවෙන් පිළිතුර ලබාදී තිබුණි.

4.8 **වාහන උපයෝජනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු වාහන 08 ක් පැවති අතර ඉන් වෙන්කළ වාහන 02 ක් හා සංචිත වාහන 06 ක් ද වශයෙන් විය.වර්ෂය තුළ ඉන්ධන සඳහා රු:817,535 ක් ද, වාහන නඩත්තු වියදම් සඳහා රු.870,474ක්ද, වැයකර තිබු නමුත් ධාවන සටහන් හා ලොග් සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධිකාරිය සතු එක් වාහනයක් 2007 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවති අතර අළුත්වැඩියා සඳහා 2010 නොවැම්බර් 26 දින රු:865,030 ක මුදලක් වැයකර තිබුණි. අළුත්වැඩියාව නිසි ලෙස සිදුකර ඇති බවට ඉංජිනේරු සහතිකයක් ලබාගැනීමක් සිදුකර නොතිබුණි.2012 මැයි 15 දින

එක විටත් මෙම වාහනය අළුත්වැඩියාව නිම කර ධාවනයට සුදුසු තත්වයට පත් කර නොතිබුණි. තවද මෙම වාහනයේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී එය අමාත්‍යාංශය සතු වාහනයක් බවත්, 2007 මැයි 27 දින අධිකාරිය වෙත පවරා ගෙන අළුත්වැඩියාව සඳහා යොමු කර ඇති බවත් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතු භාවිය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

2011 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර තිබූ නමුත් ඊ අනුව විගණන කටයුතු කර නොතිබුණි.2011 දෙසැම්බර් 09 දින දක්වා අභ්‍යන්තර විගණනකයකු පත් කර නොතිබූ අතර එක් නිලධාරියකු පමණක් වර්ෂය තුළ විගණන අංශයට අනුයුක්ත කර තිබුණි.වර්ෂය තුළ අභ්‍යන්තර විගණන විමසුම් 12ක් නිකුත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) බදවා ගැනීම්
(ඇ) අයවැය පාලනය
(ඇ) වත්කම් පාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති